කාර්යසාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

PERFORMANCE REPORT

2022

ආයුර්වේද දෙපාර්තමේන්තුව

ஆயுர்வேததி ணைக்களம்

DEPARTMENT OF AYURVEDA

පටුන

පරිච්ඡේදය	විස්තරය	පිටු අංකය
1	**ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය**	1
1.1	හැඳින්වීම	1
1.2	ආයුර්වේද දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර හා අරමුණු	1
1.3	ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්	2
1.4	ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන	3
1.5	ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ප්‍රධාන ආයතන	4
1.6	අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතනගත/ අරමුදල්	6
1.7	විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල අරමුදල්	6
2	**ප්‍රගතිය හා ඉදිරි දැක්ම**	7
2.1	විශේෂ ජයග්‍රහණ හා ප්‍රගතිය	7
2.2	ඉදිරි ඉලක්ක	72
2.3	අභියෝග	72
3	**වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය**	73
3.1	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	73
3.2	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	74
3.3	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	75
3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	76
3.5	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	77
3.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය	77
3.7	මු.රෙ 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	78
3.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	79
3.9	විගණකාධිපතිවරයාගේ වාර්තාව	80
4	**කාර්ය සාධන දර්ශක**	97
4.1	**ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)**	97
5	**තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**	97
5.1	හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු	97
5.2	තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග	97
6	**මානව සම්පත් පැතිකඩ**	97
6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	97
6.2	ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන අන්දම	97
6.3	මානව සම්පත් සංවර්ධනය	98
7	**අනුකූලතා වාර්තාව**	99

1. පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1961 අංක 31 දරණ ආයුර්වේද පනතෙහි විධිවිධාන අනුව ආයුර්වේද දෙපාර්තමේන්තුව ස්ථාපනය කර ඇත. ආයුර්වේද, සිද්ධ, යුනානි සහ දේශීය වෛද්‍ය ක්‍රමයන්ට අදාළව පර්යේෂණ සහ ශික්ෂණ කටයුතු මෙහෙයවීම, එම වෛද්‍ය ක්‍රම සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මානව සහ භෞතික සම්පත් වැඩිදියුණු කිරීම, මෙම වෛද්‍ය ක්‍රම ප්‍රචලිත කිරීම සහ සංරක්ෂණය ආදී කර්තව්‍යයන් ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබයි.

ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති පරිපාලන වගකීම් හා කාර්යයන් ඉටු කිරීමෙහිලා 2022 වර්ෂයට අදාළ ප්‍රගතිය මෙම කාර්ය සාධන වාර්තාව මඟින් ඉදිරිපත් කෙරේ.

1.2 ආයුර්වේද දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර හා අරමුණු.

දැක්ම

''ආයුර්වේද හා දේශීය වෛද්‍ය ක්‍රම තුළින් සැමට සුවසෙත''

මෙහෙවර

''ආයුර්වේද හා පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රම සංරක්ෂණය, සංවර්ධනය හා අනන්‍යතාව සුරක්ෂිත කිරීම තුළින් සැමට සුවසෙත ළඟා කර දීම සඳහා ජාතික මට්ටමින් වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම''

අරමුණු


1. ආයුර්වේද හා පාරම්පරික වෛද්‍ය ක්‍රම මඟින් මහජනයා හට ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් ලබා දීම.
2. ශික්ෂණය හා පර්යේෂණ තුළින් දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා කටයුතු කිරීම.
3. අනාගත පරම්පරාව උදෙසා දේශීය හා පාරම්පරික වෛද්‍ය ක්‍රම සංරක්ෂණය කිරීම.
4. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය විධිමත් පරිදි නියාමනය කිරීම.
5. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අවශ්‍ය ඖෂධ ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව නිෂ්පාදනය කිරීම.
6. දේශීය වෛද්‍ය ක්‍රම සංවර්ධනයට අවශ්‍ය ජාතික හා අන්තර්ජාතික ක්‍රියාමාර්ග ගැනීම තුළින් මෙරට තිරසාර සංවර්ධනයට දායකත්වය ලබා දීම.

1.3 ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

1. පර්යේෂණ හා ශික්ෂණ කටයුතු සඳහා රෝහල් හා අනෙකුත් ආයතන ස්ථාපිත කර පවත්වාගෙන යාම.
2. ශික්ෂණ කටයුතු සඳහා සම්මන්ත්‍රණ, අභ්‍යාස පන්ති හා අධ්‍යයන පාඨමාලා පැවැත්වීම.
3. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ ඖෂධ, සායනික හා සාහිත්‍ය පර්යේෂණ පැවැත්වීම.
4. පාරම්පරික හා දේශීය වෛද්‍ය ක්‍රමවල අනන්‍යතාවය රැක ගනිමින් එම වෛද්‍ය ක්‍රම ප්‍රචලිත කිරීම හා සංරක්ෂණය කිරීම.
5. දිවයිනේ සියලු ලියාපදිංචි පාරම්පරික හා ආයුර්වේද වෛද්‍යවරුන් සහ ක්ෂේත්‍රයට අදාළ අනෙකුත් සේවාවන් අධීක්ෂණය කිරීම හා පරිපාලනය කිරීම.
6. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අයත් සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන, ඖෂධ, උපකරණ, නිවාරණ හා ප්‍රතිකාර සේවා නියාමනය කිරීම.
7. ඖෂධීය ශාක වගා කිරීම, සංරක්ෂණය හා ප්‍රචලිත කිරීම.
8. දේශීය වෛද්‍ය ක්‍රම සංවර්ධනයට අවශ්‍ය ජාතික හා අන්තර්ජාතික ක්‍රියාමාර්ග ගැනීම.



1.4 ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන



1.5 ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ප්‍රධාන ආයතන

සාමාන්‍ය පරිපාලනය හා කළමනාකරණය

- ප්‍රධාන කාර්යාලය - නාවින්න

ශික්ෂණ කටයුතු

- ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල
- ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල - යක්කල
- සිද්ධ ශික්ෂණ රෝහල - කයිතඩි
- සිද්ධ ශික්ෂණ රෝහල - ත්‍රිකුණාමලය

පර්යේෂණ කටයුතු

- බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය - නාවින්න
- ආයුර්වේද පර්යේෂණ රෝහල - අම්පාර
- චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහල - හම්බන්තොට
- ආයුර්වේද (යුනානි) පර්යේෂණ රෝහල - මන්චන්තොඩුවායි
- වකුගඩු රෝග නිවාරණ ආයුර්වේද පර්යේෂණ රෝහල - මැදවච්චිය
- ආයුර්වේද පර්යේෂණ රෝහල (බෝ නොවන රෝග) - නින්දවූර් (බාහිර රෝගී අංශය)
- මෛත්‍රීපාල සේනානායක අනුස්මරණ පාරම්පරික පර්යේෂණ රෝහල - මිහින්තලය (බාහිර රෝගී අංශය)

අධ්‍යාපන හා පුහුණු කිරීම්

- දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය - නාවින්න


ප්‍රජා සෞඛ්‍ය සේවා

- ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය - අනුරාධපුර

ඖෂධීය ශාක පිළිබඳ පර්යේෂණ හා ව්‍යාප්ති සේවා

- හල්දුම්මුල්ල, නාවින්න, පට්ටිපොළ, ගිරාඳුරුකෝට්ටේ, පල්ලෙකැලේ, මිහින්තලය, පින්නදූව හා කන්නෙලිය යන පර්යේෂණ හා ව්‍යාප්ති සේවා ඔසු උයන්

ආයතන ව්‍යුහය


ආයුර්වේද දෙපාර්තමේන්තුව
ආයුර්වේද ශික්ෂණ රෝහල්
ආයුර්වේද පර්යේෂණ රෝහල්
බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය
දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය
පර්යේෂණ හා ව්‍යාප්ති සේවා ඔසු උයන්
ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල - යක්කල
සිද්ධ ශික්ෂණ රෝහල - කයිතඩි
සිද්ධ ශික්ෂණ රෝහල - ත්‍රිකුණාමලය
ආයුර්වේද පර්යේෂණ රෝහල - අම්පාර
ආයුර්වේද පර්යේෂණ රෝහල - නාවින්න
චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහල - හම්බන්තොට
ආයුර්වේද (යුනානි) පර්යේෂණ රෝහල - මන්චන්තෝඩුවායි
වකුගඩු රෝග නිවාරණ ආයුර්වේද පර්යේෂණ රෝහල - මැදවච්චිය
ආයුර්වේද පර්යේෂණ රෝහල (බෝ නොවන රෝග) - නින්දවූර් (බාහිර රෝගී අංශය)
මෛත්‍රීපාල සේනානායක අනුස්මරණ පාරම්පරික පර්යේෂණ රෝහල- මිහින්තලය
හල්දුම්මුල්ල
පට්ටිපොළ
ගිරාඳුරුකෝට්ටේ
පල්ලේකැලේ
පින්නදූව
නාවින්න
කන්නෙලිය
මිහින්තලය

1.6 අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතනගත/ අරමුදල්

නැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල අරමුදල්

ලෝක සෞඛ්‍ය සංවිධානයේ අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති යටතේ දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා දේශීය වෛද්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීමේ ව්‍යාපෘතියෙහි වැඩසටහන් දෙකක් පවත්වා ඇත. ඒ සඳහා වැයවී ඇති මුදල රු.399,180.00 ක් වේ.

2. පරිච්ඡේදය

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය හා ඉදිරි දැක්ම (2022.12.31 දිනට)

2.1 විශේෂ ජයග්‍රහණ හා ප්‍රගතිය

2.1.1 මූල්‍ය අංශයේ ප්‍රගතිය

කාණ්ඩය/වැය විෂය/අයිතමය	ප්‍රතිපාදනය (රු.)		වියදම (රු.)			
	2021	2022	2021	ප්‍රතිශතය %	2022	ප්‍රතිශතය %
පුනරාවර්තන වියදම්	2,038,650,000	1,924,043,890	1,869,204,390	91.69	1,839,206,090	95.59
1.සාමාන්‍ය පරිපාලනය	119,050,000	130,746,650	116,384,371	97.76	111,211,778	85.06
2. රෝහල් සේවා	1,549,614,024	1,404,683,240	1,408,680,282	90.91	1,369,855,192	97.52
3. පර්යේෂණ	268,578,600	276,468,800	249,698,092	92.97	261,926,942	94.74
4. අධ්‍යාපන හා පුහුණු	30,057,376	31,195,200	28,137,738	93.61	26,767,120	85.81
5. ඖෂධ වගාව සංරක්ෂණය හා ව්‍යාප්තිය	71,350,000	80,950,000	66,303,907	92.93	69,445,056	85.79
ප්‍රාග්ධන වියදම්	**729,950,000**	**35,601,710**	**388,096,922**	**53.17**	**28,036,055**	**78.75**
1.සාමාන්‍ය පරිපාලනය	12,950,000	5,253,350	10,594,992	81.81	4,183,148	79.63
2. රෝහල් සේවා	645,761,019	19,318,878	340,979,491	52.80	16,503,163	85.43
3. පර්යේෂණ	31,738,981	4,100,000	20,561,010	64.78	2,849,878	69.51
4. අධ්‍යාපන හා පුහුණු	10,500,000	2,710,100	7,743,321	73.75	2,187,173	80.70
5. ඖෂධ වගාව සංරක්ෂණය හා ව්‍යාප්තිය	29,000,000	4,219,382	8,218,108	28.34	2,312,690	54.81
මුළු වියදම්	2,768,600,000	1,959,645,600	2,257,301,312	81.53	1,867,242,145	95.28
1.සාමාන්‍ය පරිපාලනය	132,000,000	136,000,000	126,979,363	96.20	115,394,927	84.85
2. රෝහල් සේවා	2,195,375,043	1,424,002,118	1,749,659,773	79.70	1,386,358,355	97.36
3. පර්යේෂණ	300,317,581	280,568,800	270,259,102	89.99	264,776,821	94.37
4. අධ්‍යාපන හා පුහුණු	40,557,376	33,905,300	35,881,059	88.47	2,187,173	6.45
5. ඖෂධ වගාව සංරක්ෂණය හා ව්‍යාප්තිය	100,350,000	85,169,382	74,522,015	74.26	71,757,747	84.25

2.1.2 පාලන අංශයේ ප්‍රගතිය

2.1.2.1 ආයතනික කාර්යයන්

අනු අංකය	කාර්යය	සේවක ගණය	සංඛ්‍යාව
01	බඳවා ගැනීම්	ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිළධාරී ගණයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරී තනතුරු 62ක් (2022.12.31 දිනට විශ්‍රාම වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක්) සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට අනුමැතිය ලබා ගැනීම. PL 01 තනතුරු පුරප්පාඩු 491 ක් සහ රියදුරු පුරප්පාඩු 14 ක් ඇතුළුව තනතුරු 505 ක් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබාගැනීම.	
02	උසස් කිරීම්	ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ විශේෂඥ ශ්‍රේණියට උසස් වීම් ලබාදීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම. ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන 1 ශ්‍රේණියට උසස් වීම් ලබාදීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම. 2020.10.27 දින සිට ක්‍රියාත්මක වන නව සේවා ව්‍යවස්ථාවට අනුව ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් 1 ශ්‍රේණියට උසස් කිරීමට කටයුතු කිරීම. ඉහත සඳහන් උසස් වීම් වලට අමතරව පෞද්ගලික ලිපි ගොනුව මඟින් ලබාදෙන ශ්‍රේණි උසස් කිරීම් යනාදිය අදාළ කාලසීමාවන් තුළදී ලබාදී ඇත.	
04	අනුමත කාර්යමණ්ඩල සංශෝධන	ආයුර්වේද දෙපාර්තමේන්තුව හා ඊට අනුබද්ධ ආයතනයන්ට අනුමතව පැවති ආශ්‍රිත සේවයට අයත් නිලධාරීන්ගේ තනතුරු නාමය සංවර්ධන නිලධාරී ලෙස සංශෝධනය කිරීම	40
05	වෙනත්	සියළු බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවීම මැයෙන් නිකුත් කර ඇති 2020.02.21 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2020 සහ මුදල් අමාත්‍යාංශ භාණ්ඩාගාර ලේකම්ගේ අංක DMS/Policy/Recruitments සහ 2019.11.20 දිනැති ලිපිය අනුව නව බඳවා ගැනීම් සිදු කිරීමට මෙතෙක් අනුමැතියක් ලැබී නොමැත. තවද, කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2020 මඟින් 01/2020 චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු බව දන්වා ඇත.	

2.1.2.2 පුහුණු වැඩසටහන්

දේශීය පුහුණු වැඩසටහන්

අනු අංකය	පැවැත්වූ ආයතනය	සහභාගිවූ පාඨමාලාව	සේවක ගණය	ප්‍රමාණය	කාලය
01.	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	රජයේ නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම පිළිබඳ එක් දින වැඩමුළුව	කළමණාකාර සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2	01	2022.03.04
			කළමණාකාර සහකාර තාක්ෂණික නොවන බහු කාර්ය - ඛණ්ඩ 1	05	
			ආශ්‍රිත නිලධාරී	01	
02.	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දෙදින වැඩමුළුව	කළමණාකාර සහකාර තාක්ෂණික නොවන බහු කාර්ය - ඛණ්ඩ 1	02	2022.03.08 2023.03.09
03.	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ දෙදින වැඩමුළුව	ආශ්‍රිත නිලධාරී	01	2022.03.24 2023.03.25
04.	SDFL	පෞද්ගලික ලිපි ගොනුවක් පවත්වාගෙනයාම පිළිබඳ දෙදින වැඩමුළුව	ආශ්‍රිත නිලධාරී 1	04	2022.03.31 2022.04.01
05.	SDFL	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම "B" ගිණුම පිළියෙල කිරීම පිළිබඳ එක් දින වැඩමුළුම (ZOOM තාක්ෂණය ඔස්සේ)	කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බහු කාර්ය - ඛණ්ඩ 1	01	2022.03.09
06.	Faculty of Medicine – University of Colombo	Certificate course in Postgraduate Research	වෛද්‍ය නිලධාරීන්	01	2022 පෙබරවාරි - 2022 ජූලි
07	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම	කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බහු කාර්ය - ඛණ්ඩ 1	01	2022.11.21 2022.11.28
08	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	ගිණුම් ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම	ආශ්‍රිත නිලධාරී	01	2022.12.13
09	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	කාර්යාල සටහන් ලිවීම හා රාජකාරි ලිපි ලිවීම	ආශ්‍රිත නිලධාරී	01	2022.11.30

2.1.2.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)
			දේශීය	විදේශීය	
රජයේ නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම පිළිබඳ එක් දින වැඩමුළුව	7	2022.03.04	රු. 35,000.00	-	දේශීය
ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දෙදින වැඩමුළුව - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	2	2022.03.08, 2022.03.09	රු.20,000.00	-	දේශීය
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ දෙදින වැඩමුළුව - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	1	2022.03.24 / 25	රු.10,000.00	-	දේශීය
පෞද්ගලික ලිපි ගොනුවක් පවත්වාගෙනයාම පිළිබඳ දෙදින වැඩමුළුව - SDFL	4	2022.03.31, 2022.04.01	රු.34,000.00	-	දේශීය
රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම “B” ගිණුම පිළියෙල කිරීම පිළිබඳ එක් දින වැඩමුළුම (ZOOM තාක්ෂණය ඔස්සේ) - SDFL	1	2022.03.09	රු.3,750.00	-	දේශීය
Certificate course in Postgraduate Research - Faculty of Medicine University of Colombo	1	2022 පෙබරවාරි - 2022 ජූලි	රු.30,000.00	-	දේශීය
විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	1	2022.11.21, 2022.11.28	රු.10,000.00	-	දේශීය
ගිණුම් ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	1	2022.12.13	රු.5,000.00	-	දේශීය
කාර්යාල සටහන් ලිවීම හා රාජකාරි ලිපි ලිවීම - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	1	2022.11.30	රු.5,000.00	-	දේශීය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)
			දේශීය	විදේශීය	
රජයේ නිලධාරින්ගේ වැටුප් සකස් කිරීම පිළිබඳ එක් දින වැඩමුළුව	7	2022.03.04	රු. 35,000.00	-	දේශීය
ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දෙදින වැඩමුළුව - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	2	2022.03.08, 2022.03.09	රු.20,000.00	-	දේශීය
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ දෙදින වැඩමුළුව - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	1	2022.03.24 / 25	රු.10,000.00	-	දේශීය
පෞද්ගලික ලිපි ගොනුවක් පවත්වාගෙනයාම පිළිබඳ දෙදින වැඩමුළුව - SDFL	4	2022.03.31, 2022.04.01	රු.34,000.00	-	දේශීය
රජයේ නිලධාරින්ගේ අත්තිකාරම “B” ගිණුම පිළියෙල කිරීම පිළිබඳ එක් දින වැඩමුළුම (ZOOM තාක්ෂණය ඔස්සේ) - SDFL	1	2022.03.09	රු.3,750.00	-	දේශීය
Certificate course in Postgraduate Research - Faculty of Medicine University of Colombo	1	2022 පෙබරවාරි - 2022 ජූලි	රු.30,000.00	-	දේශීය
විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	1	2022.11.21, 2022.11.28	රු.10,000.00	-	දේශීය
ගිණුම් ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	1	2022.12.13	රු.5,000.00	-	දේශීය
කාර්යාල සටහන් ලිවීම හා රාජකාරි ලිපි ලිවීම - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	1	2022.11.30	රු.5,000.00	-	දේශීය

2.1.3 සංවර්ධන අංශයේ ප්‍රගතිය

2.1.3.1 භෞතික සම්පත් සංවර්ධන කටයුතු

අළුත්වැඩියා කටයුතු ප්‍රගතිය

වැය විෂය	කාර්යය	මූල්‍ය ප්‍රතිපාදනය (රු)	මූල්‍ය ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය %
220-01-01-1303	ප්‍රධාන කාර්යාලයේ එදිනෙදා ඇති සුළු අළුත්වැඩියා	100,000	100	100
220-01-01-2001	ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන අළුත්වැඩියා	1,000,000	82.2	100
220-02-02-1303	ආයුර්වේද ශික්ෂණ රෝහල් වල සුළු අළුත්වැඩියා	200,000	99.1	100
220-02-02-2001	ආයුර්වේද ශික්ෂණ රෝහල් වල ප්‍රධාන අළුත්වැඩියා	10,900,000	75.5	95
220-02-03-1303	නාවින්න බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ සුළු අළුත්වැඩියා	100,000	100	100
220-02-03-2001	නාවින්න බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ ප්‍රධාන අළුත්වැඩියා	1,600,000	98	100
220-02-02-04-2001	දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ ප්‍රධාන අළුත්වැඩියා	500,000	55.3	100
220-02-02-05-2001	ඔසු උයන් වල ප්‍රධාන අළුත්වැඩියා	2,000,000	47.7	100
220-02-02-05-2105	ඔසු උයන් වල භූමිය සංවර්ධනය	141,622	0	0

2.1.3.2 ඔසු වගාව සංවර්ධන කාර්යයන් හා ව්‍යාප්ති සේවාවන්

ඔසු උයන් , ඔසු වගා ක්ෂේත්‍ර හා වෙනත් කාර්යයන්හි ප්‍රගතිය - 2022

1 තරුණ ඔසු ගොවි ව්‍යාපෘතිය

1 ඔසු ගම්මාන පිහිටුවීම









ඔසු ගම්මාන පිහිටුවීම

වලල්ලාවිට හා දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස - පුහුණු වැඩසටහන් / රෝපණ ද්‍රව්‍ය ලබා දීම හා ක්ෂේත්‍ර පරීක්ෂාව.

2 හරිතකී නගර ඔසු උදානය






මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ක්ෂේත්‍ර පරික්ෂාව හා ඔසු වගාව සඳහා නිර්දේශ ලබා දීම

අනුරාධපුර දිස්ත්‍රික්කය **(2022.03.29/30)**





මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ක්ෂේත්‍ර වල ඔසු වගා ආරම්භය **(2022.10.24)**





රාම උද්‍යානය, කඩුවෙල නගර උද්‍යානය පිහිටුවීම සඳහා ක්ෂේත්‍ර පරික්ෂාව **(2022.03.18)**

3 ඔසු වගා ක්ෂේත්‍රය ස්ථාපනය කිරීම





වෙන්ගලවෙට්ටිකුලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - වවුනියා දිස්ත්‍රික්කය (2022.01.31)

සහය - කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය





ඔසු වගා ක්ෂේත්‍රය - පදවිය

නෙල්ලි වගාව හා අස්වනු ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත ලබාදීම

4 විශේෂ ව්‍යාපෘති

1 ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා ඔසු ගම්මාන පිහිටුවීමේ ව්‍යාපෘතිය









මී පැණි නිෂ්පාදන ගම්මාන ඇති කිරීම සඳහා මී මැසි පාලන පුහුණු වැඩසටහන් පැවැත්වීම

ගලේවෙල /නාවුල /දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 03 ප්‍රතිලාභීන් 40 ක් සඳහා මී මැසි පෙට්ටි, ධූමක, මුහුණු ආවරණ ලබා දීම.

2 "සුවධරණී" හෙළ ඔසු සංරක්ෂණය හා සංවර්ධන වැඩසටහන

1 ඖෂධීය ශාක හා අමුද්‍රව්‍ය නිෂ්පාදනය ඉහල නැංවීමේ වැඩසටහන්

අනු අංකය	වගා ක්ෂේත්‍රයේ පිහිටි ප්‍රා.ලේ.කො/ ග්‍රා.නි වසම	ඖෂධීය අමුද්‍රව්‍ය නාමය හා කොටස	ප්‍රමාණය	ප්‍රතිලාභීන්
1.	දිවුලපිටිය	හීන් අරත්ත, මොටෙයි	**3,100**	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයීය ප්‍රතිලාභීන්
2.	මිනුවන්ගොඩ	වදකහ (බඳුන්)	**250**	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයීය ප්‍රතිලාභීන්
3.	හෝමාගම	හීන් අරත්ත, මොටෙයි	**1,900**	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයීය ප්‍රතිලාභීන්
4.	වලල්ලාවිට	හීන් අරත්ත පැළ(බඳුන්)	**500**	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයීය ප්‍රතිලාභීන්

2 ඖෂධීය අමුද්‍රව්‍ය සැපයීම

අනු අංකය	ඔසු උයන	ඖෂධීය අමුද්‍රව්‍ය නාමය හා කොටස	ප්‍රමාණය (Kg)	ආයතනය
1.	පට්ටිපොල	ලොත්සුබුල්	**301**	ආයුර්වේද ඖෂධ සංස්ථාව
2.	හල්දුම්මුල්ල	ලොත්සුබුල්	**206**	ආයුර්වේද ඖෂධ සංස්ථාව
3.	පට්ටිපොල	එඩරු කොළ	**15**	ජාතික ආයුර්වේද රෝහල - බොරැල්ල
4.	පල්ලෙකැලේ	මලිත මල් - වියලි	**1.5**	බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය
		නෙල්ලි - වියලි	**4**	
		කොල්ලන් කොළ - වියලි	**1.5**	
		කිරාත - වියලි	**2**	

3 එළවළු වගාව / වියලි ඖෂධ සැකසීම

පින්නදුව ඔසු උයන / ගිරාඳුරුකෝට්ටේ ඔසු උයන













4 ඖෂධ පැළ නිෂ්පාදනය

පින්නදුව ඔසු උයන / පට්ටිපොල ඔසු උයන













පින්නදුව ඔසු උයන / පල්ලෙකැලේ ඔසු උයන

















5 ඔසු පැළ හා වගා පිළිබඳ උපදෙස් ලබාදීම









2.1.3.3 දේශීය වෛද්‍ය ක්‍රම ප්‍රචලිත කිරීම

1 ප්‍රදර්ශනය - ජේෂ්ඨ පුරවැසියන් හා පාසල් ළමුන් සඳහා

දෙහිවල සත්වෝද්‍යානය, සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව (2022.12.23 – 25)







ජේෂ්ඨ පුරවැසියන් දැනුවත් කිරීමේ වැඩසටහන

2 ග්‍රන්ථ හා අත්පත්‍රිකා මුද්‍රණය

ඖෂධීය ශාක වගාව හා ප්‍රමිති අමුද්‍රව්‍ය නිෂ්පාදනය - අත්පොත 2 මුද්‍රණය කිරීම



3 රෝගී ප්‍රතිකාර සේවා - ජංගම සායන

අනු අංකය	සායනය පැවැත්වූ ආයතනය	පැවැත්වූ සංඛ්‍යාව
01.	පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තු (ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් පවරනු ලැබූ)	15
සම්බන්ධීකරණය කරන ලද මුළු වැඩසටහන් ගණන		**15**

2.1.4 ශිල්පීය අංශයේ ප්‍රගතිය

2.1.4.1 ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය සඳහා අයදුම්පත් නිකුත් කිරීම

අනු අංකය	ලියාපදිංචි කළ ආයතන	එක් අයදුම්පතක වටිනාකම (රු.)	අයදුම්පත් සංඛ්‍යාව	ලැබූ ආදායම (රු)
1	ප්‍රතිකාර මධ්‍යස්ථාන, පංචකර්ම මධ්‍යස්ථාන, සහ හෝටල් තුළ පංචකර්ම මධ්‍යස්ථාන	100.00	124	12,400.00
2	රෝහල්		21	2,100.00
3	වෙළඳසල්		298	29,800.00
4	නිෂ්පාදනාගාර		328	32,800.00
5	ඖෂධ ආනයනික ආයතන/ගබඩා		14	1,400.00
6	දේශීය ඖෂධ සඳහා		477	47,700.00
7	ආනයනික ඖෂධ සඳහා	500.00	109	54,500.00
	එකතුව		**1,371**	**180,700.00**

2.1.4.2 ලියාපදිංචිය සඳහා අයදුම්පත් භාර ගැනීම

අනු අංකය	ලියාපදිංචි කළ ආයතන	එක් අයදුම්පතක වටිනාකම (රු.)	අයදුම්පත් සංඛ්‍යාව	ලැබූ ආදායම (රු)
1	ප්‍රතිකාර මධ්‍යස්ථාන - ප්‍රථම	1,300.00	64	83,200.00
	ප්‍රතිකාර මධ්‍යස්ථාන - වාර්ෂික	1,000.00	45	4,500.00
2	පංචකර්ම මධ්‍යස්ථාන - ප්‍රථම	-	-	-
	පංචකර්ම මධ්‍යස්ථාන - වාර්ෂික	3,000.00	8	24,000.00
3	හෝටල් තුළ පංචකර්ම මධ්‍යස්ථාන - ප්‍රථම	3,000.00	5	15,000.00
	හෝටල් තුළ පංචකර්ම මධ්‍යස්ථාන - වාර්ෂික	3,000.00	11	33,000.00
4	රෝහල් - ප්‍රථම	3,000.00	3	9,000.00
	රෝහල් - වාර්ෂික	3,000.00	12	36,000.00
5	වෙළඳසල්- ප්‍රථම	1,300.00	96	124,800.00
	වෙළඳසල්- වාර්ෂික	1,000.00	262	262,000.00
6	නිෂ්පාදනාගාර - ප්‍රථම	5,000.00	70	350,000.00
	නිෂ්පාදනාගාර - වාර්ෂික	3,000.00	261	783,000.00
7	ඖෂධ ආනයනික ආයතන / ගබඩා	5,000.00	5	25,000.00
8	ප්‍රවාහන - ප්‍රථම	1,000.00	17	17,000.00
	ප්‍රවාහන - වාර්ෂික	500.00	61	30,500.00
9	නියැදි පරීක්ෂා කිරීම සඳහා - දේශීය	750.00	168	126,000.00
	නියැදි පරීක්ෂා කිරීම සඳහා - ආනයනික	4,000.00	70	280,000.00
	එකතුව		**1,158**	**2,203,000.00**

2.1.4.3 ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් බලපත්‍ර නිකුත් කිරීම

අනු අංකය	ආයතන සඳහා බලපත්‍ර නිකුත් කළ සංඛ්‍යාව	එක් බලපත්‍රයක වටිනාකම (රු.)	බලපත්‍ර සංඛ්‍යාව	ලැබූ ආදායම (රු)
1	ප්‍රතිකාර මධ්‍යස්ථාන	-	12	-
2	පංචකර්ම මධ්‍යස්ථාන - ප්‍රථම	-	-	-
	පංචකර්ම මධ්‍යස්ථාන - වාර්ෂික	8,000.00	7	56,000.00
3	හෝටල් තුළ පංචකර්ම මධ්‍යස්ථාන - ප්‍රථම	15,000.00	7	105,000.00
	හෝටල් තුළ පංචකර්ම මධ්‍යස්ථාන - වාර්ෂික	10,000.00	13	13,000.00
4	රෝහල් - ප්‍රථම	10,000.00	9	90,000.00
	රෝහල් - වාර්ෂික	7,500.00	14	105,000.00
5	වෙළඳසල්- ප්‍රථම	-	65	-
	වෙළඳසල්- වාර්ෂික	-	128	-
6	නිෂ්පාදනාගාර	-	349	-
7	ඖෂධ ආනයනික ආයතන / ගබඩා	-	5	-
8	ප්‍රවාහන	-	78	-
9	ආනයනික ඖෂධ සඳහා - නව	12,000.00	133	15,466,641.00
	ආනයනික ඖෂධ සඳහා - අලුත් කිරීම්	6,500.00	153	1,159,971.00
10	සාම්පල් ආනයනය සඳහා	-	56	-
11	දේශීය ඖෂධ සඳහා - නව	500.00 (වර්ෂයකට)	186	277,000.00
	දේශීය ඖෂධ සඳහා - අලුත් කිරීම්	200.00 (වර්ෂයකට)	64	48,200.00
12	මාධ්‍ය බලපත්‍ර නිකුත් කිරීම - දේශීය	500.00	17	8,500.00
	මාධ්‍ය බලපත්‍ර නිකුත් කිරීම - ආනයනික	500.00	6	3,000.00
13	නිදහස් වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම	500.00	16	8,000.00
14	වියළි ඖෂධ ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම	500.00	225	112,500.00
15	විරෝධතාවයක් නොමැති බවට ලිපි නිකුත් කිරීම	100.00	23	2,300.00
	විරෝධතාවයක් නොමැති බවට සාම්පල් ආනයනය සඳහා ලිපි නිකුත් කිරීම	500.00	6	3,000.00
	එකතුව		**1,572**	**17,458,112.00**

2.1.4.4 කමිටු පැවැත්වීම

අනු අංකය	කමිටුව	පැවැත්වූ වාර ගණන
1	තාක්ෂණික අනු කමිටුව	38
2	මාධ්‍ය ප්‍රචාරණ කමිටුව	3
3	සූත්‍ර කමිටුව	16
4	තීරුබදු රහිතව ඖෂධ ආනයන කමිටුව	18
	එකතුව	**75**

2.1.4.5 ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර සඳහා කංසා, පරිපාක ස්ප්‍රීතු නිර්දේශ ලබා දීම

අනු අංකය	කාර්යය	සංඛ්‍යාව
1	කංසා සඳහා නිකුත් නළ නිර්දේශ ලිපි සංඛ්‍යාව	18
2	නිකුත් කළ කංසා චූර්ණ ප්‍රමාණය	262Kg 440g
3	පරිපාක ස්ප්‍රීතු නිකුත් කළ ප්‍රමාණය	44830L 500ml

2.1.5 විභාග අංශයේ ප්‍රගතිය

2.1.5.1 විභාග පැවැත්වීම

අනු අංකය	විභාගයේ නම	මාසය	විභාගය පැවැත්වූ දිනය/ පැවැත්වීමට තීරණය කළ දිනය	ශිෂ්‍ය සංඛ්‍යාව
01	ආයුර්වේද ශාස්ත්‍රී අතිරේක පරීක්ෂණය - 2021 (ප්‍රතිඵල නිකුත් කිරීම)	2022 පෙබරවාරි	2022.02.18	317
02	ලංකා සිද්ධ වෛද්‍ය විද්‍යාලයේ අවසන් වසර සිසුන් සඳහා වන පරීක්ෂණය - 2022	2022 පෙබරවාරි	2022.02. ,21,22, 23,24,25,26	19
03	පාරම්පරික වෛද්‍යවරුන් සඳහා ලිඛිත පරීක්ෂණය	2022 මාර්තු	2022.03.12, 13	291
04	ආයුර්වේද වෛද්‍යවරුන්ගේ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය - 2021 (ප්‍රතිඵල නිකුත් කිරීම)	2022 අප්‍රේල්	2022.04.08	153
06	රජයේ ඖෂධ සංයෝජක ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව (දෙමළ මාධ්‍ය)- අවසාන ඇගයීම් පරීක්ෂණය	2022 ජුනි	2022.06.24,27,28	19
07	පාරම්පරික වෛද්‍යවරුන් සඳහා ලිඛිත පරීක්ෂණය (ප්‍රතිඵල නිකුත් කිරීම)	2022 ඔක්තෝම්බර්	2022.10.14	450
08	ආයුර්වේද ශාස්ත්‍රී වාර්ෂික පරීක්ෂණය - 2022	2022 ඔක්තෝම්බර්	2022.10.29,30 2022.11.05,06,12	487
09	PL- 01, PL - 02,, කේත අංක යටතේ බඳවාගත් තනතුරු සඳහා කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණ පැවැත්වීම.	2022 දෙසැම්බර්	2022.12.01,02	76
11	ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික ඛණ්ඩය, කාර්මික නිලධාරී (MT-01, MN-03) සඳහා වන කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය - 2022	2022 දෙසැම්බර්	2022.12.05	02
12	ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරී (II) ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය -2022	2022 දෙසැම්බර්	2022.12.10	176

2.1.5.2 රැස්වීම් පැවැත්වීම හා ලබා ගන්නා ලද තීරණ

21 වෙනි ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලය - 2022.02.14

අනු අංක	සාකච්ඡා කළ කරුණ	තීරණය
01	ලංකා සිද්ධ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ අවසාන අතිරේක පරීක්ෂණය	2022.02.20 සිට 26 දක්වා පවත්වා අවසන් කරන බව දන්වන ලදි.
02	විභාග අවස්ථා 20 කට එක් ශිෂ්‍යයකුට මුහුණ දීමට හැකිවනු පිණිස ශිෂ්‍ය හැදුනුම්පතේ කාලය දීර්ඝ කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම. ➢ 2016 වසර වෙනුවෙන් අවසන් වරට විභාගය පවත්වන ලදි. විභාගයට මුහුණදීම සඳහා නියමිත අවස්ථාවන් ලබාදීම ශිෂ්‍යයින්ගේ අයිතිවාසිකම් ලබා දීමකි. එබැවින් ලියාපදිංචි වූ අවුරුද්ද අනුව එක් එක් ශිෂ්‍යයා වෙනුවෙන් වෙන වෙනම කාලය ගණනය කර ලේඛණයක් පිළියෙල කර ඉදිරි රැස්වීමට ඉදිරිපත් කිරීම.	ඉදිරිපත් කරන ලද වාර්තාව සඳහා මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදි. අදාළ ශිෂ්‍යයාගේ ඉල්ලීම හෝ අවශ්‍යතාවය අනුව අදාළ ඉදිරි කාලය වෙන වෙනම ඉදිරිපත් කළ හැකි බව දැන්වීය.
03	සිහල ආයුර්වේදික් ලංකා (පුද්.) සමාගම වෙත පැවැත්විය යුතු පාඨමාලා පිළිබඳව දේශීය වෛද්‍ය විද්‍යායතනය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විශ්වවිද්‍යාලය හා දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය වෙතින් අදාළ පාඨමාලා සම්බන්ධ නිර්ණායක හා මාර්ගෝපදේශ ලබා ගැනීමට කටයුතු කිරීම.	ඒ අනුව ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය විසින් මෙවැනි පාඨමාලා අනුමත නොකරන බව දන්වා ඇත. අනෙකුත් ආයතන වෙතින් මේ පිළිබඳව විමසීම් කිරීම.
04	සීමාවාසික වෛද්‍ය පුහුණුවේ නිබන්ධන රචනය පිළිබඳ උපදෙස් මාලාව හා ඇගයීම් ක්‍රමවේදයට අදාළ ලියවිලි සඳහා අනුමැතිය ඉල්ලීමට අදාළව රාජගිරිය දේශීය වෛද්‍ය විද්‍යායතනය හා ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යාලය වෙතින් ඔවුන්ගේ නිරීක්ෂණ වාර්තාවන් එවන ලෙස දන්වා යවන ලදි.	අදාළ ආයතන වෙතින් මෙතෙක් ප්‍රතිචාර නොමැති අතර, මෙම නිබන්ධන රචනය විශ්ව විද්‍යාල මට්ටමින් විවාදාත්මක වී ඇති නමුත් නව විෂයය නිර්දේශයට මෙය අන්තර්ගත වී ඇති බව ප්‍රකාශ විය.
05	දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය මඟින් ඉදිරිපත් කර ඇති සීමාවාසික වෛද්‍යවරුන්ගේ පුහුණුව සම්බන්ධව අත් පොත, මාර්ගෝපදේශ සංග්‍රහයක් ලෙස රජයේ මුද්‍රාව ද සහිතව දේශීය වෛද්‍ය විද්‍යායතනය - රාජගිරිය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද වෛද්‍ය විශ්වවිද්‍යාලය හා යාපනය විශ්ව විද්‍යාලය - කයිතඩි, නැගෙනහිර විශ්ව විද්‍යාලය - ත්‍රිකුණාමලය වෙත මෙන්ම දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය වෙත නිරීක්ෂණ කැඳවීමේ ලිපි යොමු කරන ලදි.	ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද වෛද්‍ය විශ්ව විද්‍යාලය හා යාපනය විශ්ව විද්‍යාලය විසින් පමණක් මේ සඳහා ප්‍රතිචාර දක්වා ඇත. දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය විසින් මේ සම්බන්ධව විධිමත් පාඨමාලා වැඩසටහනක් සකස් කර ඇත.

06.	1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 55(1) ඉ යටතේ හා 55(2) වගන්තිය යටතේ ගැනෙන පාරම්පරික ලියාපදිංචි අපේක්ෂිත අයැදුම්කරුවන් පාරම්පරික වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කිරීමේ ලිඛිත පරීක්ෂණය ආයුර්වේද දෙපාර්තමේන්තුවේ විභාග අංශය මඟින් ඉටු කිරීම	අනුමත කිරීමට තීරණය කරන ලදි. විභාග පැවැත්වීම සම්බන්ධ සියළුම වියදම් ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් දැරීමෙන් පසුව ආයුර්වේද වෛද්‍ය සභාව මඟින් ප්‍රතිපූරණය කර ගැනීමට ද කටයුතු කිරීම.
07.	සමාජ මාධ්‍ය හරහා ලද ආයුර්වේද අධ්‍යාපනය පිලිබඳ පළකිරීම් අත්හිටුවන ලෙස දන්වා යැවීම. ඒ අනුව අදාළ ආයතනය වන International Institute of Ceylon Ayurveda ආයතනය විසින් පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් ලෙස ලියාපදිංචිය ඉල්ලුම් කර ඇති බව දැන්වීය.	අදාළ කටයුතු පවත්වා ගෙන යාම සඳහා තාවකාලික ලියාපදිංචියක් ලබා දීමට සලකා බලන ලදි. එහිදී හදුනාගත් අඩු පාඩු පිළිබඳව අදාළ ආයතනය දැනුවත් කිරීමට තීරණය විය.
08.	ජී. ශිරාණි ඉන්දිකා දමයන්ති (ලි.ප.අංක 8761) චිකිත්සාපත්‍ර භාරදීමට කල් ඉල්ලීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය	තවදුරටත් දීර්ඝ කළ නොහැකි බව තීරණය සඳහා අදාළ කරුණු දැක්වීමක් අවශ්‍ය බව තීරණය කරන ලදි. ඒ අනුව, • 2002 වර්ෂයේදි අංක 8761 යටතේ ආයුර්වේද ශාස්ත්‍රී විභාගය සඳහා ලියාපදිංචිය ලබා ගෙන ඇත. • ප්‍රාරම්භ පරීක්ෂණය 2002 දෙසැම්බර් මස ද, මධ්‍යම පරීක්ෂණය 2012 නොවැම්බර් මසද, අවසාන පරීක්ෂණය 2015 නොවැම්බර් මසද (පැරණි නිර්දේශය යටතේ පරීක්ෂණ අවස්ථා 09කදී) සම්පූර්ණ කර ඇත. • සය මාසික ප්‍රායෝගික පුහුණුවෙන් තොරව වෛද්‍ය සභාවේ ලියාපදිංචිය සඳහා දිවුරුම් පෙත්සමක් මඟින් මැය ඉල්ලා ඇති අතර අංක 5/2/2 Board . Me.2020 හා 2020.12.10 දිනැති ලිපියෙන් 2020.12.15 දින සිට 2021.06.15 දින දක්වා කාලයක් මෙම පුහුණුව සඳහා කාලය ලබාදී මෙවැනි ඉල්ලීම් ඉදිරියේදී නොකරන ලෙස තරයේ දන්වා යවා ඇත.

09.	දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය විසින් යොමු කර ඇති පෞද්ගලික ආයුර්වේද සම්භාහන පාඨමාලාව-කායික සුදුසුකම් පිළිබඳ ලිපිය අනුමත කරන ලදි.	අනුමැතිය දන්වා යවන ලදි.
10.	මණ්ඩල සාමාජික වෛද්‍යාචාර්ය යූ.වලවගේ මයාගෙන් දේශීය වෛද්‍ය කේෂ්ත්‍රය වෙනුවෙන් සිදු කරන ලද සේවාව ඇගයීම හා පවුලේ ඥාතීන් වෙත ශෝකය ප්‍රකාශ කර ලිපි යොමු කිරීමට තීරණය විය.	පවුලේ සාමාජිකයින් වෙත දන්වා යවන ලදි.
	යෝජනා හා වෙනත් කරුණු	
01.	විභාග පාලක මණ්ඩලයේ සාමාජික සංශෝධනය.	විභාග පාලක මණ්ඩලයේ ඇතැම් නිළධාරීන් නිසි පරිදි අදාළ රැස්වීම් සඳහා සහභාගී නොවන බැවින් විභාග කටයුතු කාර්යක්ෂමව කිරීම සඳහා නව සාමාජිකයකු ලෙස ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය එම්. ආර්. එම්. වික්‍රමසිංහ මිය පත් කිරීමට තීරණය කරන ලදි.
02.	පිරිවෙන් අධ්‍යාපනයට ආයුර්වේද පාඨමාලා නැවත ආරම්භ කිරීම.	මේ සම්බන්ධව දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයේදී පැවැත්වීමට නියමිත සාකච්ඡා රැස්වීමක් සඳහා දේශීය වෛද්‍ය විද්‍යායතනයෙන් මෙම විෂයය කේෂ්ත්‍රයේ ප්‍රවීනයන් ද සහභාගි කර ගැනීමට තීරණය විය.
03.	2021.11.16 සිට 2021.11.27 දක්වා බොරැල්ල ශික්ෂණ රෝහලේ පවත්වනු ලැබූ ඖෂධ සංයෝජක ප්‍රායෝගික පරීක්ෂණයේ නිරීක්ෂකගේ වාර්තාව	මෙම වාර්තාවෙන් හඳුනාගත් ගැටළු හා දුර්වලතා අධ්‍යනය කර සංශෝධන ඇති කර යුතු බව තීරණය විය.
04.	පාරම්පරික ලියාපදිංචි අපේක්ෂිත පාරම්පරික ආයුර්වේද සහ සඳහා පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයේ පරීක්ෂක මණ්ඩලයේ නාම ලේඛණය	අනුමත කරන ලදි.
05.	දේශීය වෛද්‍ය විද්‍යායතනය විසින් යොමුකළ ආයුර්වේද ෆාමසි සහතික පත්‍ර පාඨමාලා අන්තර්ගතය	මෙම පාඨමාලාව ඩිප්ලෝමා පාඨමාලාවක් දක්වා තත්ත්වය උසස් කළ යුතු බවට යෝජනා විය.
06.	ආයුර්වේද ශාස්ත්‍රී අතිරේක පරීක්ෂණය -2016 (2021 පෙබ.) පරීක්ෂණයේ ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා අනුමැතිය	ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදි. ඉදිරියේදී අදාළ ලකුණු ලේඛණය ඉදිරිපත් කළ යුතු බවට තීරණය විය.

07.	“SLGAMOA විසින් යොමු කර ඇති BAMS/BSMS/BUMS/උපාධි හදාරණ සිසුන් සඳහා අවධිමත් ප්‍රායෝගික අධ්‍යාපනයක් ලබාදීම” මැයෙන් වූ ලිපිය	ඉදිරියේදී මේ පිළිබඳව වැඩිදුර සාකච්ඡා කිරීමට තීරණය විය.
08.	“SUBJECT BENCHMARK STATEMENT IN INDIGENOUS MEDICINE “sent by UGC (Ministry letter)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දියත් කරන ලද ජාත්‍යන්තර ප්‍රමිතිය ලත් ප්‍රකාශනයක් බැවින් ප්‍රතිපත්තිමය තීරණයක් ලෙස අනුමැතිය ලබා දෙන ලදි.
09.	“ESTABLISHMENT OF FACULTY OF SIDDHA MEDICINE IN TRINCOMALEE CAMPUS EASTERN UNIVERSITY OF SRI LANKA” Sent by UGC. (Ministry letter)	ඉහත අංක 08 හි අනුමැතිය පරිදි, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සකස් කරන ලද දේශීය වෙදකම් පිළිබඳ උපාධි පාඨමාලා සඳහා ජාත්‍යන්තරව පිළිගත් පොදු ලියවිල්ලක් ප්‍රකාශ ඇති බැවින් එය BAMS/BUMS/BSMS උපාධි පාඨමාලා සඳහා අදාළ කර ගතයුතු බවට තීරණය විය.
10.	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යාපීඨය මඟින් පවත්වාගෙන යනු ලබන ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය ශ්‍රී ලංකාවේ ආයුර්වේද වෛද්‍ය සභාවේ පිළිගැනීමට ලක් කිරීම මැයෙන් ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලය ලිපිය.	ඉදිරියේදී සලකා බැලීමට තීරණය විය.

2022.08.16

අනු අංක	**සාකච්ඡා කළ කරුණු**	**තීරණය**
01.	කාලීන ආර්ථික තත්ත්වය, රටේ පවතින කඩදාසි හිඟතාවය හා රාජ්‍ය ආයතන වල වියදම් සීමා කිරීම හේතු කොට ගෙන කඩදාසි භාවිතය අවම කිරීමේ ප්‍රතිපත්තිය.	දැනට ලබා දෙන මණ්ඩල රැස්වීම් වාර්තාව සංක්ෂිප්තව (අවම කඩදාසි ප්‍රමාණයක් භාවිතයෙන්) ලබා දීම. ඒ අනුව මණ්ඩල සාමාජිකයන් සම්බන්ධීකරණය කරමින් Whatsapp සමූහයක් ස්ථාපිත කර ඒ හරහා අදාළ තොරතුරු සාමාජිකයන් වෙත සම්ප්‍රේෂණය කිරීමට තීරණය විය.
02.	ලංකා සිද්ධ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ අවසාන අතිරේක පරීක්ෂණය-2022 මාණ්ඩලික පත්‍රිකාව සඳහා අනුමැතිය ලබා ගැනීම.	අනුමැතිය ලබා දීමට තීරණය විය.

03.	පෞද්ගලික අධ්‍යාපන ආයතන ලෙස ආයුර්වේද අධ්‍යාපනය පිළිබඳ පාඨමාලා හා පුහුණු වීම් කටයුතු වල නියැලීම. Haritha Lanka Ayurveda Piaysa (Pvt)Ltd. International Institute of Ceylon Ayurveda Karunakarala Ayurveda and Yoga Institute Training Institute of Holistic Medicine International Institute of Ceylon Ayurveda ආයතනය විසින් තම ප්‍රවර්ධන කටයුතු අරමුණු කොට ගෙන ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අනුමැතිය භාවිතා කරයි නම් අන්තර්ජාලය හරහා එසේ දැන්වීම් පළ කිරීම අත්හිටුවන ලෙස තරයේ අවවාද කළ යුතු බව දැනුම් දීම.	තාවකාලික අනුමැතියක් ලබා දීම අනුමත කරන ලදි. මේ වන විටත් ඒ පිළිබඳව අදාළ ආයතනය වෙත දුරකථනයෙන් දැනුම් දුන් බව ලේඛකාධිකාරි විසින් දන්වන ලදි.
04.	දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය මඟින් සංශෝධන සහිතව ඉදිරිපත් කර ඇති සීමාවාසික වෛද්‍යවරුන්ගේ පුහුණුව සම්බන්ධව අත් පොත	සුළු සංශෝධනයන්ට යටත්ව අනුමත කරන ලදි. ඉදිරි රැස්වීමේදී අදාළ සංශෝධන ඉදිරිපත් කිරීමට තීරණය විය.
05.	පාරම්පරික ලියාපදිංචි අපේක්ෂිත අයැදුම්කරුවන් පාරම්පරික වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කිරීමේ ලිඛිත පරීක්ෂණයෙහි ප්‍රතිඵල නිකුත් කිරීම.	ලකුණු ඇතුළත් කිරීමේ කටයුතු මේ දිනවල සිදු කෙරෙමින් පවතින බවත් කඩිනමින් ප්‍රතිඵල නිකුත් කරන බවත් දන්වන ලදි.
06.	ජී.ශිරාණි ඉන්දිකා දමයන්ති මිය විසින් චිකිත්සා පත්‍ර භාර දීමට කාලය තවදුරටත් දීර්ඝ කරන ලෙස කරන ලද ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට අදාළ කරුණු ඉදිරිපත් කිරීම.	තවදුරටත් දීර්ඝ නොකිරීමේ තීරණය දන්වා යැවීම.
07.	පහත නම් සඳහන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් ආයුර්වේද ශාස්ත්‍රී විභාගය සඳහා නැවත අවස්ථාව ලබා ගැනීමට ඉදිරිපත් වූ ඉල්ලීම් සලකා බැලීම. 01.චමල් සමීර වෛද්‍යසිංහ 02.පාතිමා ලක්මාලි පීරිස් 03.ලෙලනි කුමාරි ගුණතිලක 04.මනින්ද්‍ර කමලපානි උඩුවහවර	ආයුර්වේද ශාස්ත්‍රී විභාගය සඳහා පෙනී සිටිය හැකි අවස්ථා 20 ම ලබා ගෙන ඇති බැවින් නැවත අවස්ථා ලබා නොදීමට තීරණය විය.

08.	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය කේ.අයි.ඩබ්ලිව්.කේ. සෝමරත්න මයා විසින් යොමු කරන ලද විභාග පාලක මණ්ඩල සභාපති ධූරයෙන් ඉල්ලා අස්වීමේ 2022.07.26 දිනැති ලිපිය	ඉල්ලා අස්වීමේ ලිපිය භාරගත් අතර ඉල්ලා අස්වීමෙන් පුරප්පාඩු වූ විභාග පාලක මණ්ඩලයේ සභාපති ධුරය සඳහා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය එම්. ආර්. එම්. වික්‍රමසිංහ මිය පත් කිරීම.
09.	පිරිවෙන් අධ්‍යාපනයට ආයුර්වේද පාඨමාලා නැවත ආරම්භ කිරීම.	අදාළ වාර්තාව සලකා බලන ලදි. ආයුර්වේද ජීවන දර්ශනය පිළිබඳ අධ්‍යාපනය ලබා දීම ගැටලු සහගත නොවන බව යෝජනා විය.
10.	ඉදිරියේදී පැවැත්වීමට නියමිත විභාග සඳහා අවශ්‍ය කඩදාසි සපයා ගැනීමේ දුෂ්කරතාවයක් පැන නැගීම.	අවශ්‍ය කඩදාසි ප්‍රමාණය ඇස්තමේන්තුවක් සකස් කර අදාළ අංශ වෙත යොමු කිරීමෙන් අනතුරුව ඒවා සපයා ගැනීමට ඇති අවස්ථා පිළිබඳ සොයා බැලීමට තීරණය විය.
11.	දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය විසින් පෞද්ගලික සම්බාහන පුහුණු පාඨමාලාවේ යාවත්කාලීන කළ විෂය නිර්දේශය සඳහා අනුමැතියට ඉදිරිපත් කිරීම	අනුමත කරන ලදි.
12.	දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය විසින් ඉදිරිපත් කළ “ IMO’S Guide to Research Project ” මැයෙන් වූ ලියවිලි අනුමැතියට ඉදිරිපත් කිරීම.	අනුමත කරන ලදි.
13.	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය විසින් අනුමැතිය සඳහා යොමු කරන ලද “ Establishment of Indigenous Medical Entrepreneurship Development Courses” මැයෙන්වූ ලිපිය.	පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා සඳහා පමණක් අනුමැතිය ලබා දීමට තීරණය විය. 1.Postgraduate Diploma in Kayacikitsa 2.Postgraduate Diploma in Shalyatantra 3.Postgraduate Diploma in Pancakarma 4.Postgraduate Diploma in Management and Administration of Ayurveda Institutions Leading to Master of Science 5.Postgraduate Diploma in Yoga Science

14.	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලය මඟින් ආරම්භ කිරීමට නියමිත ශල්‍ය තන්ත්‍ර පශ්චාත් උපාධිය සම්බන්ධව වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් යොමු කල ලිපිය	අදාළ පාඨමාලාව ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලය විසින් පිළිනොගන්නා බව දන්වා යැවීමට තීරණය විය.
15.	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යාපීඨය මඟින් පවත්වාගෙන යනු ලබන ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය ශ්‍රී ලංකාවේ ආයුර්වේද වෛද්‍ය සභාවේ පිළිගැනීමට ලක් කිරීම. මැයෙන් ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලය ලිපිය.	ඉදිරියේදී සලකා බැලීමට තීරණය විය.

2022.09.20

අනු අංක	සාකච්ඡා කළ කරුණු	තීරණය
01.	කාලීන ආර්ථික තත්ත්වය, රටේ පවතින කඩදාසි හිඟතාවය හා රාජ්‍ය ආයතන වල වියදම් සීමා කිරීම හේතු කොට ගෙන කඩදාසි භාවිතය අවම කිරීමේ ප්‍රතිපත්තිය මත මණ්ඩල සාමාජිකයන් සම්බන්ධීකරණය කරමින් Whatsapp සමූහයක් ස්ථාපිත කර ඒ හරහා අදාළ තොරතුරු සාමාජිකයන් වෙත සම්ප්‍රේෂණය කිරීම.	අදාළ තීරණය ක්‍රියාත්මක කරන ලදි.
02.	පෞද්ගලික අධ්‍යාපන ආයතන ලෙස ආයුර්වේද අධ්‍යාපනය පිළිබඳ පාඨමාලා හා පුහුණු වීම් කටයුතු වල නියැලීම සඳහා තාවකාලික අනුමැතියක් ලබා දීම. Haritha Lanka Ayurveda Piaysa (Pvt)Ltd. International Institute of Ceylon Ayurveda Karunakarala Ayurveda and Yoga Institute Training Institute of Holistic Medicine	මෙම ආයතන සඳහා තාවකාලික අනුමැතිය පිරිනමා ඇති බව දන්වන ලදි. ඉදිරියේදී ලියාපදිංචිය ලබාදීම සඳහා පහත කරුණු පිළිබඳව අවධානය යොමු විය යුතු බව දැන්වීම ➢ පෞද්ගලික අධ්‍යාපන පාඨමාලා නියාමනයේදී තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පුහුණු කොමිෂම මඟින් පිළිගත් මාර්ගෝපදේශ අනුගමනය කිරීම. ➢ ලියාපදිංචිය සිදු විය යුත්තේ තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පුහුණු කොමිෂම හරහා බව දන්වන ලදි. ➢ ඉදිරි රැස්වීම සඳහා තෘතීක සහ වෘත්තීය අධ්‍යාපන පුහුණු

		කොමිෂම විසින් අනුමත කළ පාඨමාලා ඉදිරිපත් කිරීමට තීරණය විය.
03.	දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය මඟින් සංශෝධන සහිතව ඉදිරිපත් කර ඇති සීමාවාසික වෛද්‍යවරුන්ගේ පුහුණුව සම්බන්ධව අත් පොත සුළු සංශෝධනයන්ට යටත්ව අනුමත කිරීම.	අනුමැතිය අදාළ සංශෝධන ද සමඟ දන්වා යවන ලදි.
04.	පාරම්පරික ලියාපදිංචිය අපේක්ෂිත අයදුම්කරුවන් පාරම්පරික වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කිරීමේ ලිඛිත පරීක්ෂණයෙහි ප්‍රතිඵල නිකුත් කිරීම.	විභාග පාලක මණ්ඩලය කැඳවීමෙන් අනතුරුව ප්‍රතිඵල ආයුර්වේද වෛද්‍ය සභාව වෙත නිකුත් කරන බවත් දන්වන ලදි.
05.	පහත නම් සඳහන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් ආයුර්වේද ශාස්ත්‍රී විභාගය සඳහා නැවත අවස්ථාව ලබා ගැනීමට ඉදිරිපත් වූ ඉල්ලීම් සලකා බැලීම. 01.පාතිමා ලක්මාලි පීරිස් මිය 02.මනින්ද්‍ර කමලපානි උඩුවහවර මයා	ආයුර්වේද ශාස්ත්‍රී විභාගය සඳහා පෙනී සිටිය හැකි අවස්ථා 20ම සම්පූර්ණ කර ඇති අයෙකු හට අවසාන පරීක්ෂණයෙහි පෙනී සිටීමට ඇත්තේ එක් විෂයක් පමණක් නම් නැවත එක් අවස්ථාවක් පමණක් ලබා දීමටත් ඉන් පසුව කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා නොබැලීමටත් තීරණය විය. ඒ අනුව පාතිමා ලක්මාලි පීරිස් මිය හා මනින්ද්‍ර කමලපානි උඩුවහවර මයා හට නැවත අවස්ථා ලබා නොදෙන බව දන්වා යැවීමට තීරණය විය. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවෙහි ලියාපදිංචි වීමෙන් අනතුරුව පාරම්පරික වෛද්‍යවරුන් සඳහා වන පරීක්ෂණය සඳහා පෙනී සිටිය හැකි බව තීරණය විය.
06.	ඉදිරියේදී පැවැත්වීමට නියමිත විභාග සඳහා අවශ්‍ය කඩදාසි සපයා ගැනීමේ දුෂ්කරතාවයක් පැන නැඟීම.	අවශ්‍ය කඩදාසි ප්‍රමාණය ඇස්තමේන්තුවක් සකස් කර අදාළ අංශ වෙත යොමු කිරීමෙන් අනතුරුව ඒවා සපයා ගැනීමට ඇති අවස්ථා පිළිබඳ සොයා බැලීම සිදු කළද නිශ්චිත විසඳුමක් ලැබී නොමැති බව දන්වන ලදි.
07.	දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය විසින් පෞද්ගලික සම්බාහන පුහුණු පාඨමාලාවේ යාවත්කාලීන කළ විෂය නිර්දේශය සඳහා අනුමැතිය ලබා දීම.	අදාළ අනුමැතිය දන්වා යවන ලදි.

08.	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය විසින් අනුමැතිය සඳහා යොමු කරන ලද “ Establishment of Indigenous Medical Entrepreneurship Development Courses” මැයෙන්වූ ලිපිය සලකා බැලීමෙන් අනතුරුව තෝරාගත් පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා සඳහා පමණක් අනුමැතිය ලබා දීම.	ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයට අනුව II ශ්‍රේණිය සඳහා උසස් වීමේදී පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම සුදුසුකමක් බවත් දැනටමත් මෙම ඩිප්ලෝමා සම්පූර්ණ කර උසස් වීම් ලබා ගත් පිරිසක් සිටින බැවින් තෝරාගත් පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා පමණක් අනුමැතිය හිමි විය. ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලයෙහි සහ ආයුර්වේද වෛද්‍ය සභාවෙහි ලියාපදිංචිය සඳහා සුදුසු පාඨමාලා සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ආයුර්වේද/සිද්ධ/යුනානි පාඨමාලා පවත්වනු ලබන විශ්වවිද්‍යාල ද නියෝජනය වන පරිදි අනුකමිටුවක් පත් කිරීමට තීරණය කරන ලදි.
09.	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යාපීඨය මඟින් පවත්වාගෙන යනු ලබන ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය ශ්‍රී ලංකාවේ ආයුර්වේද වෛද්‍ය සභාවේ පිළිගැනීමට ලක් කිරීම. මැයෙන් ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලය ලිපිය.	ඉහත සඳහන් අනුකමිටුවට ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදි.
10.	පහත සඳහන් ලිපි ලේඛන බැහැර කිරීමේ සුදුසු වැඩ පිළිවලක් පිළිබඳ ගත හැකි ක්‍රියාමාර්ග පිලිබඳ සාකච්ඡා කිරීම. • ආයුර්වේද ශාස්ත්‍රී අවසාන පරීක්ෂණයන්හි ලකුණු පත්‍රිකා • ලංකා සිද්ධ විද්‍යාලයේ අවසන් වසර සිසුන් සඳහා පවත්වන ලද අවසාන පරීක්ෂණයන්හි ලකුණු පත්‍රිකා • ආයුර්වේද ශාස්ත්‍රී අවසාන පරීක්ෂණය සමත් සිසුන් විසින් ඉදිරිපත් කරන ලද චිකිත්සා පත්‍ර ග්‍රන්ථ (1994-2015 දක්වා)	වසර 10 කට වඩා පැරණි ලේඛන මණ්ඩලය විසින් ලබා දෙන අනුමැතියක් පරිදි තීරු කර කඩදාසි කර්මාන්ත ශාලාව වෙත ලබා දිය හැකි බව යෝජනා විය.

11.	දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය විසින් ඉදිරිපත් කළ ආයුර්වේද හෙද පුහුණුවෙහි විෂය නිර්දේශය.	මාස 03ක පමණ පාඨමාලාවක් බැවින් සේවා උසස් වීමක් සඳහා ලබා දෙන ඩිප්ලෝමා පාඨමාලාවක් ලෙස පිරිනැමිය හැකි බව යෝජනා විය. ඉදිරි රැස්වීමේදී මේ පිළිබඳ අදහස් හා යෝජනා ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදි.
	වෙනත් කරුණු	
01.	'Doctor of Medicine in Ayurveda in Prasutitantra Streeroga and Board certification 2019 Prospectus' මැයෙන් සිදු කළ සාකච්ඡාව	මෙහි ඉදිරිපත් කර ඇති මොඩියුල 01, 02, 03, 04, 05, 06, 07, 08 සහ 09 සඳහා අනුමැතිය හිමි විය. මොඩියුල 10, 11, 12 සහ 13 (ගර්භ ගර්භනී විඥානය, ප්‍රසව විඥානය, සූතිකා විඥානය, ශල්‍ය නිපුණතා සඳහා පහත සඳහන් ප්‍රායෝගික කරුණු සලකා බලන ලදි. පූර්ව ප්‍රසව පරිපාලනය සහ පසු ප්‍රසව පරිපාලනය පිළිබඳ දැනුම ආයුර්වේද රෝහල් හිදී ලබා දිය හැකි බවත් ප්‍රසූති සිදු කිරීම සඳහා කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය යොදා ගැනීම පිළිබඳව සාකච්ඡා කෙරෙමින් පවතින බවත් හඳුනාගත් අනුමත ඉන්දියානු ආයතනයක පුහුණුව ලබාදීම මෙහි සඳහන් වන බවත් අදාළ අංශ විසින් දැනුම් දෙන ලදි. ආයුර්වේද ශික්ෂණ රෝහල-බොරැල්ල හි ප්‍රසූතීන් සිදු කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන ද නොමැති පසුබිමක මෙම පාඨමාලා වලට අදාළ ප්‍රායෝගික දැනුම ශිෂ්‍යයන් හට ලබා දීම අපහසු බව තීරණය විය. ඉන්දියානු රෝහල් වල රෝගීන් හැසිරවීම සඳහා ලැබෙන අවස්ථාව ඉතා සීමිත බව ප්‍රකාශ විය. ඉන්දියානු අධ්‍යාපන ආයතන මෙතෙක් මේ සඳහා එකඟත්වය පල කර නොමැති බව ද අනාවරණය විය.

		ප්‍රසව හා නාරීවේදය පිළිබඳ ඇතැම් කොටස් හා ශල්‍යමය දැනුම කොටසක් ද මෙම පාඨමාලාවෙන් ඉවත් කර ඇති බව අදාළ අංශ විසින් දැනුම් දෙන ලදි. මෙම විෂයට අදාළ ඉන්දියානු පශ්චාත් උපාධියෙහි ඉහත සියලුම කොටස් ඇතුළත් වන බැවින් එකම විෂය පථයක් සඳහා තත්ත්ව දෙකක පශ්චාත් උපාධිධාරින් බිහි වුවද සේවා ව්‍යවස්ථාව තුළ එකම මට්ටමක (විශේෂඥ වෛද්‍ය නිලධාරී තනතුර) ස්ථානගත කිරීමේ දී නීතිමය ගැටලු බොහොමයක් පැන නැගිය හැකි බවට අදහස් ඉදිරිපත් විය. මෙම පාඨමාලාව සැකසීමෙහි සහ ක්‍රියාත්මක කිරීමෙහි ලා අදාළ විද්වත් මණ්ඩලය විසින් දරණ ලද උත්සාහය ආයුර්වේද අධ්‍යාපන සහ ආරෝග්‍යශාලා මණ්ඩලයෙහි පැසසුමට ලක් විය.

2022.10.25

අනු අංක	සාකච්ඡා කළ කරුණ	තීරණය
01.	පෞද්ගලික අධ්‍යාපන ආයතන ලෙස ආයුර්වේද අධ්‍යාපනය පිළිබඳ පාඨමාලා හා පුහුණු වීම් කටයුතු වල නියැලීම සඳහා තාවකාලික අනුමැතියක් ලබා දීම. Haritha Lanka Ayurveda Piaysa (Pvt)Ltd. International Institute of Ceylon Ayurveda Karunakarala Ayurveda and Yoga Institute Training Institute of Holistic Medicine	පෞද්ගලික අධ්‍යාපන පාඨමාලා නියාමනයේදී තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පුහුණු කොමිසම මඟින් පිළිගත් මාර්ගෝපදේශ අනුගමනය කිරීම සඳහා වන NVQ වැඩසටහන පිළිබඳ වාර්තාව තවමත් ලැබී නොමැති බව සඳහන් කරන ලදි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් පසුව ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලය යටතට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු කොමිෂන් සභාව යටතේ පවතින පුහුණු පාසල්හි නියාමන කටයුතු පැවරෙන අතර මෙම පාඨමාලාවන්හි

		විභාග කටයුතු විභාග දෙපාර්තමේන්තුව සමඟ ද සම්බන්ධ වී අදාළ මාර්ගෝපදේශ අනුගමනය කරමින් පැවැත්වීමට අදහස් කරන බව වැඩිදුරටත් සඳහන් කරන ලදි.
02.	පාරම්පරික ලියාපදිංචි අපේක්ෂිත අයැදුම්කරුවන් පාරම්පරික වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කිරීමේ ලිඛිත පරීක්ෂණයෙහි ප්‍රතිඵල නිකුත් කිරීම.	ප්‍රතිඵල නිකුත් කරන ලදි.
03.	පහත නම් සඳහන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් ආයුර්වේද ශාස්ත්‍රී විභාගය සඳහා නැවත අවස්ථාව ලබා ගැනීමට ඉදිරිපත් වූ ඉල්ලීම් සලකා බැලීම. 01. පාතිමා ලක්මාලි පීරිස් මිය 02. මනින්ද්‍ර කමලපානි උඩුවහවර මයා	ආයුර්වේද ශාස්ත්‍රී විභාගය සඳහා පෙනී සිටිය හැකි අවස්ථා 20ම සම්පූර්ණ කර ඇති අයෙකු හට අවසාන පරීක්ෂණයෙහි පෙනී සිටීමට ඇත්තේ එක් විෂයක් පමණක් නම් නැවත එක් අවස්ථාවක් පමණක් ලබා දීමටත් ඉන් පසුව කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා නොබැලීමටත් ගත් තීරණය මත පාතිමා ලක්මාලි පීරිස් මිය හා මනින්ද්‍ර කමලපානි උඩුවහවර මයා හට නැවත අවස්ථා ලබා නොදෙන බව දන්වා යවන ලදි.
04.	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය විසින් අනුමැතිය සඳහා යොමු කරන ලද “ Establishment of Indigenous Medical Entrepreneurship Development Courses” මැයෙන්වූ ලිපිය සලකා බැලීමෙන් අනතුරුව තෝරාගත් පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා සඳහා පමණක් අනුමැතිය ලබා දීම.	ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලයෙහි සහ ආයුර්වේද වෛද්‍ය සභාවෙහි ලියාපදිංචිය සඳහා සුදුසු පාඨමාලා සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ආයුර්වේද/සිද්ධ/යුනානි පාඨමාලා පවත්වනු ලබන විශ්වවිද්‍යාල ද නියෝජනය වන පරිදි අනුකමිටුවක් පත් කර එය රැස් කරන ලදි. අනුකමිටු වාර්තාව අනුමත වීමෙන් අනතුරුව අදාළ තීරණ දන්වා යවන බව සඳහන් කරන ලදි.
05.	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යාපීඨය මඟින් පවත්වාගෙන යනු ලබන ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය ශ්‍රී ලංකාවේ ආයුර්වේද වෛද්‍ය සභාවේ පිළිගැනීමට ලක් කිරීම මැයෙන් ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලය ලිපිය.	ඉහත සඳහන් අනුකමිටුව වෙත ඉදිරිපත් කරන ලදි. අනුකමිටු වාර්තාව අනුමත වීමෙන් අනතුරුව අදාළ තීරණ දන්වා යවන බව සඳහන් කරන ලදි.

06.	දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය විසින් ඉදිරිපත් කළ ආයුර්වේද හෙද පුහුණුවෙහි විෂය නිර්දේශය	වෙනම පාඨමාලාවක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදි.
07.	'Doctor of Medicine in Ayurveda in Prasutitantra Streeroga and Board certification 2019 Prospectus' මැයෙන් සිදු කල සාකච්ඡාව	ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලයෙහි සහ ආයුර්වේද වෛද්‍ය සභාවෙහි ලියාපදිංචිය සඳහා සුදුසු පාඨමාලා සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන අනුකමිටු රැස්වීමේදී මේ පිළිබඳ වැඩිදුරටත් සාකච්ඡා කරන ලදි. අනුකමිටු වාර්තාව අනුමත වීමෙන් අනතුරුව අදාළ කරුණු ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලය වෙත ඉදිරිපත් කරන බව සඳහන් කරන ලදි.
08.	" Nature Lanka Health Resort" ආයතනය විසින් ඉදිරිපත් කළ කෙටිකාලීන ආයුර්වේද පාඨමාලා සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ ඉල්ලීම් ලිපිය සහ විෂය නිර්දේශය	පාඨමාලා සංයුතිය/ විෂය නිර්දේශයන් හා පාඨමාලා කාලයන්හි පවතින න්‍යායාත්මක හා ප්‍රායෝගික ගැටලු තත්ත්වයන් පැවතීම හේතුවෙන් අනුමැතිය ලබා දිය නොහැකි බව තීරණය විය.
09.	දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය මඟින් පවත්වනු ලැබූ "පෞද්ගලික ආයුර්වේද සම්බාහන සහතික පත්‍ර පුහුණු පාඨමාලාව" හි විභාග කටයුතු පැවැත්වීම සඳහා පරීක්ෂණයට පෙනී සිටිය හැකි පුහුණුලාභීන් පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම.	පැමිණීම 80% සම්පූර්ණ නොකිරීමෙන් එම පුහුණුලාභීන් හට ලැබෙන න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික දැනුම මට්ටමෙහි ඇතිවන ඌනතාවය මහහරවා ගැනීමෙන් පාඨමාලාවෙහි ප්‍රමිතිය කෙරෙහි ඇති වන බලපෑම අවම කර ගත යුතු බැවින් එම පුහුණුලාභීන් සඳහා පැමිණීම 80% සම්පූර්ණ කර ගත හැකි වන පරිදි යම් කාලයක් ලබා දීම හෝ කෙටි කාලීන පාඨමාලාවක් පැවැත්විය යුතු බව දන්වා යැවීමට තීරණය විය.
10.	"පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ලිඛිත පරීක්ෂණය - 2022" ප්‍රතිඵල නැවත සමීක්ෂණය සඳහා වන අයදුම්පත්‍රය	අනුමත කරන ලදි.
11.	ආයුර්වේද දෙපාර්තමේන්තුවේ විභාග අංශයේ විභාග දින දර්ශනය - 2022	මෙම වර්ෂය සඳහා ඉදිරියේදී පැවැත්වීමට නියමිත විභාග හා

		පැවැත්වීමට නියමිත කාලය පිළිබඳව අවධානය යොමු කරන ලදි.
12.	ආයුර්වේද ශාස්ත්‍රී අවසාන වසර සමත් සිසුන්ගේ ප්‍රායෝගික පුහුණු වාර්තා පරීක්ෂකගේ නිර්දේශය සහිතව මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කිරීම (එම්.ඕ.ආර්.මීගොඩ: ලි.ප.අ.9968)	අදාළ ප්‍රායෝගික පුහුණු වාර්තා සඳහා අනුමැතිය ලබා දෙන ලදි.

2022.11.22

අනු අංක	සාකච්ඡා කළ කරුණු	තීරණය
01.	පෞද්ගලික අධ්‍යාපන ආයතන ලෙස ආයුර්වේද අධ්‍යාපනය පිළිබඳ පාඨමාලා හා පුහුණු වීම් කටයුතු වල නියැලීම සඳහා තාවකාලික අනුමැතියක් ලබා දීම. Haritha Lanka Ayurveda Piaysa (Pvt)Ltd. International Institute of Ceylon Ayurveda Karunakarala Ayurveda and Yoga Institute Training Institute of Holistic Medicine	පෞද්ගලික අධ්‍යාපන ආයතන 2023 ජනවාරි මස සිට තෘතීක සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සහ ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලය යටතේ නියාමනය වීමට නියමිත අතර විභාග පැවැත්වීමේ කටයුතු ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලය විසින් සිදු කිරීමට නියමිතය. ජාත්‍යන්තරව පිළිගත් සහතිකයක් වන මෙය ආයුර්වේද කොමසාරිස්, තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙහි අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙහි අධ්‍යක්ෂ ජනරාල් යන නිලධාරීන්ගේ අත්සනින් යුතුව නිකුත් කිරීමට තීරණය කර ඇති බව සඳහන් කරන ලදි. මෙම පාඨමාලාව සාර්ථකව නිම කරන තැනැත්තන් වෙනම වෘත්තික ලැයිස්තුවක් ලෙස වෛද්‍ය සභාවෙහි ලියාපදිංචි කිරීමට නියමිත බව ද වැඩිදුරටත් සඳහන් කරන ලදි.

03.	පහත නම් සඳහන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් ආයුර්වේද ශාස්ත්‍රී විභාගය සඳහා නැවත අවස්ථාව ලබා ගැනීමට ඉදිරිපත් වූ ඉල්ලීම් සලකා බැලීම. 01. පාතිමා ලක්මාලි පීරිස් මිය 02. මනින්ද්‍ර කමලපානි උඩුවහවර මයා	අදාළ ඉල්ලිම් ප්‍රතික්ෂේප කරන ලද අතර ඒ බව ලිඛිතව දන්වා යැවීමට තීරණය විය.
04.	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය විසින් අනුමැතිය සඳහා යොමු කරන ලද " Establishment of Indigenous Medical Entrepreneurship Development Courses" මැයෙන්වූ ලිපිය සලකා බැලීමෙන් අනතුරුව තෝරාගත් පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා සඳහා පමණක් අනුමැතිය ලබා දීම.	අදාළ තීරණ ඇතුළත් අනුකමිටු වාර්තාව සංශෝධන ද සලකා බැලීමෙන් අනතුරුව අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.
05.	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යාපීඨය මඟින් පවත්වාගෙන යනු ලබන ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය ශ්‍රී ලංකාවේ ආයුර්වේද වෛද්‍ය සභාවේ පිළිගැනීමට ලක් කිරීම මැයෙන් ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලය ලිපිය.	අදාළ තීරණ ඇතුළත් අනුකමිටු වාර්තාව සංශෝධන ද සලකා බැලීමෙන් අනතුරුව අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.
06.	දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය විසින් ඉදිරිපත් කළ ආයුර්වේද හෙද පුහුණුවෙහි විෂය නිර්දේශය සඳහා අනුමැතිය ලබා දීම.	අදාළ තීරණය දන්වා යවන ලදි.
07.	" Doctor of Medicine in Ayurveda in Prasutitantra Streeroga and Board certification 2019 Prospectus " මැයෙන් සිදු කළ සාකච්ඡාව	අදාළ තීරණ ඇතුළත් අනුකමිටු වාර්තාව සංශෝධන ද සලකා බැලීමෙන් අනතුරුව අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.
08.	" Nature Lanka Health Resort " ආයතනය විසින් ඉදිරිපත් කල කෙටි කාලීන ආයුර්වේද පාඨමාලා සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ ඉල්ලීම් ලිපිය සහ විෂය නිර්දේශය අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.	පාඨමාලා සංයුතිය/ විෂය නිර්දේශයන් හා පාඨමාලා කාලයන්හි පවතින න්‍යායාත්මක හා ප්‍රායෝගික ගැටලු තත්ත්වයන් පැවතීම හේතුවෙන් අනුමැතිය ලබා දිය නොහැකි බව දන්වා යවන ලදි.
09.	දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය මඟින් පවත්වනු ලැබූ " පෞද්ගලික ආයුර්වේද සම්බාහන සහතික පත්‍ර පුහුණු පාඨමාලාව" හි විභාග කටයුතු පැවැත්වීම සඳහා පරීක්ෂණයට පෙනී සිටිය හැකි පුහුණුලාභීන් පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම.	පුහුණුලාභීන් සඳහා පැමිණීම 80% සම්පූර්ණ කර ගත හැකි වන පරිදි යම් කාලයක් ලබා දීම හෝ කෙටි කාලීන පාඨමාලාවක් පැවැත්විය යුතු බව දන්වා යවන ලදි.
12.	ආයුර්වේද ශාස්ත්‍රී අවසාන වසර සමත් සිසුන්ගේ ප්‍රායෝගික පුහුණු වාර්තා පරීක්ෂකගේ නිර්දේශය සහිතව මණ්ඩලයේ අනුමැතිය ලබා දීම. (එම්.ඕ.ආර්.මීගොඩ)	අදාළ අනුමැතිය ආයුර්වේද වෛද්‍ය සභාව වෙත දන්වා යවන ලදි.

13.	දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි අධ්‍යනය ආයතනය විසින් ඉදිරිපත් කර ඇති පශ්චාත් උපාධි පාඨමාලාවන්හි විෂය නිර්දේශ	අදාළ විෂය නිර්දේශ සංයුතිය පිළිබඳව අවධානය යොමු කරන ලදි.
14.	පෞද්ගලික අධ්‍යාපන ආයතන ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍ර පරීක්ෂා කර නිර්දේශ ලබා දීම. • International Institute of Ceylon Ayurveda • Karunakarala Ayurveda and Yoga Institute • Training Institute of Holistic Medicine • Haritha Lanka Ayurveda Piyasa	ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන ස්ථානීය පරීක්ෂාවකින් අනතුරුව සහ 2023 ජනවාරි මස සිට ක්‍රියාත්මක කිරීමට නියමිත NVQ පාඨමාලා අන්තර්ගතය සහ ව්‍යුහය වෙත අනුගත යුතු වීම යන කරුණු වලට යටත්ව ලියාපදිංචිය ලබා දීමට තීරණය විය.
15.	ආයුර්වේද අධ්‍යාපනය සම්බන්ධ NVQ පාඨමාලාවන්හි, • ආයතන හා විභාග නියාමන කටයුතු සඳහා අවබෝධතා ගිවිසුමක් (Memorandum Of Understanding) සකස් කිරීම • ප්‍රශ්න පත්‍ර පරීක්ෂකයින් පත් කිරීම • විභාග කටයුතු සංවිධානය • NVQ සඳහා ඇතුළත් කළයුතු වෙනත් පාඨමාලා පිළිබඳ අදහස් හා යෝජනා විමසීම.	NVQ පාඨමාලාවන්හි ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීමෙහි වැඩි වගකීම ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලය වෙත පැවරෙන බවත් පාඨමාලාව ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් ක්‍රියාත්මක කරන බවත් ලබාදෙන සහතිකයෙහි QR කේතයක් ඇතුළත් කිරීමට නියමිත බවත් සඳහන් කරන ලදි. NVQ සඳහා ප්‍රථමයෙන් ඇතුළත් කරනු ලබන්නේ ආයුර්වේද සම්බාහන පාඨමාලාව බව ද සඳහන් කරන ලදි. NVQ සඳහා ඇතුළත් කළයුතු වෙනත් පාඨමාලා ලෙස ඖෂධ සංයෝජක සහ ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍රයට සම්බන්ධ තාක්ෂණික තනතුරු සඳහා වන පාඨමාලා මෙහිදී යෝජනා විය.
16.	ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලය සඳහා වෙනම ගිණුම් ගත ක්‍රමවේදයක් සැකසීම/ ආයුර්වේද වෛද්‍ය සභාව මෙන් වෙනම ස්වාධීන ආයතනයක් බවට පත් කිරීම සඳහා වූ යෝජනාව	පවතින ආයුර්වේද පනත අනුව මෙම යෝජනාව සඳහා අනුමැතිය ලබා දිය නොහැකි බවත් පනත සංශෝධනය කිරීමෙන් අනතුරුව මේ පිළිබඳ සලකා බැලිය හැකි බවත් දන්වන ලදි. NVQ පාඨමාලා සම්බන්ධ ගිණුම් කටයුතු සඳහා කැබිනට් අනුමැතියක් ලබා ගැනීමට යෝජනා විය.
17.	මාලේවන ඥානිස්සර ආයුර්වේද ශාස්ත්‍රී විද්‍යාලය මඟින් පවත්වනු ලබන අවසර නොලත් පාඨමාලා සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග	මේ සම්බන්ධව අදාළ විද්‍යාලය දැනුවත් කරන ලෙස දන්වන ලදි.

18.	ලියාපදිංචිය ලත් පෞද්ගලික අධ්‍යාපන ආයතන විසින් සිසුන් සඳහා ලබාදෙන සහතික පත්‍ර ආකෘතිය නැවත සකස් කිරීම සඳහා වන යෝජනාව	සම්මත සහතික පත්‍ර ආකෘතියක් සකස් කිරීමට තීරණය විය. අදාළ ආයතන වල දැනට භාවිතා කරනු ලබන සහතික පත්‍ර ආකෘති ගෙන්වා ගැනීමටත් QR කේතයක් අදාළ සහතිකයට ඇතුළත් කිරීමටත් තීරණය විය.
19.	ආයුර්වේද දෙපාර්තුමේන්තුවෙහි ලියාපදිංචිය ලබා ඇති බවට පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් විසින් ලබා දී ඇති ව්‍යාජ සහතික පත්‍රය සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ග	ව්‍යාජ සහතික පත්‍ර නිර්මාණය කිරීම වැලැක්වීමට සම්මත සහතික පත්‍ර ආකෘතියට QR කේතයක් ඇතුළත් කිරීමටත් යෝජනා විය.
20.	ආයුර්වේද දෙපාර්තුමේන්තුවෙහි ලියාපදිංචිය ලබා ඇති පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් වන ‘‘ඔසෙත්මා ආයුර්වේද හා දේශීය වෛද්‍ය විද්‍යාලය’’ විසින් 2019 වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ සිසු නාම ලේඛනය නැවත සංශෝධනය කර ඉදිරිපත් කිරීම සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ග	දැනට ලියාපදිංචිය ලබා ඇති පෞද්ගලික අධ්‍යාපන ආයතන වෙතින් පසුගිය වර්ෂයට අදාළව පාඨමාලා හදාරන ලද සිසුන්ගේ තොරතුරු ලබා ගැනීමෙන් අනතුරුව අදාල නාම ලේඛනයට අනුව පමණක් ඉදිරි කටයුතු සිදු කිරීමත් ආයතන අධීක්ෂණයට ක්‍රමවේදයක් සකස් කිරීමටත් යෝජනා විය.
21.	ආයුර්වේද ශාස්ත්‍රී ඩිප්ලෝමා පාඨමාලාවෙහි පරිවර්තිත නාමය සම්බන්ධ ගැටලුව සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ග	ජාත්‍යාන්තරව පිළිගැනීමට ලක්වන අයුරින් භාවිතා කළ හැකි පරිදි පාඨමාලාවෙහි නම සංශෝධනය කිරීමට යෝජනා විය.
22.	ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලය යටතේ ලියාපදිංචිය ලබා ඇති ආයතන පුවත්පත් දැන්වීමක් මඟින් ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා වූ යෝජනාව	මෙම යෝජනාව සඳහා අනුමැතිය හිමි විය.
23.	යාපනය සිද්ධ විද්‍යාලයෙහි ආයුර්වේද ශාස්ත්‍රී සිසුන්ගේ නව ලියාපදිංචි කටයුතු සිදු කිරීම හා පාඨමාලාව පැවැත්වීමේ ඉදිරි කටයුතු සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලුව	මෙම විද්‍යාලය පළාත් සභා රෝහලක් බවට පත් කිරීම සඳහා ද යාපනය විශ්ව විද්‍යාලයෙහි සිද්ධ පීඨය සමඟ ඒකාබද්ධ කිරීම සඳහා ද යෝජනා ඉදිරිපත් වූ අතර මූලික පියවරක් ලෙස විද්‍යාලය නිරීක්ෂණය කළ යුතු බව ද සඳහන් කරන ලදි.

2.1.6 ආයුර්වේද ශික්ෂණ රෝහල්

2.1.6.1 මූලික තොරතුරු

රෝහල	බොරැල්ල		යක්කල		කයිතඩ්		ත්‍රිකුණාමලය	
ආරම්භය	**1929.06.10**		**1984**		**1973.06.29**		**2009.07.06**	
වර්ෂය	2021	2022	2021	2022	2021	2022	2021	2022
වාට්ටු ගණන	13	13	4	4	5	5	2	2
ඇඳන් සංඛ්‍යාව	247	247	104	104	150	150	10	10
වෛද්‍යවරුන් ගණන	121	139	58	62	16	16	6	6
හෙද කාර්ය මණ්ඩලය	34	28	19	20	2	2	2	2
අනෙකුත් කාර්ය මණ්ඩලය	108	141	77	64	42	45	7	8

2.1.6.2 ශික්ෂණ පහසුකම් ලබා දෙන ලද වෛද්‍ය සිසුන්

රෝහල	බොරැල්ල		යක්කල		කයිතඩ්		ත්‍රිකුණාමලය	
වර්ෂය	**2021**	**2022**	**2021**	**2022**	**2021**	**2022**	**2021**	**2022**
ශික්ෂණ පහසුකම් ලබා ගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව	198	442	201	378	357	260	300	400

2.1.6.3 රෝගී ප්‍රතිකාර සේවා ලද ප්‍රතිලාභීන්

රෝහල	බොරැල්ල		යක්කල		කයිතඩ්		ත්‍රිකුණාමලය	
වර්ෂය	**2021**	**2022**	**2021**	**2022**	**2021**	**2022**	**2021**	**2022**
බාහිර	82,957	128,249	20,912	29,221	25,645	24,175	9,481	9,584
නේවාසික	1,549	1,704	382	998	449	554	17	25
සායන	79,690	110,730	19,612	33,720	8,883	9,414	1,591	7,116
පංචකර්ම	412	397	300	451	412	194	24	20

2.1.6.4 ප්‍රජා සෞඛ්‍ය සත්කාරක සේවා ලද ප්‍රතිලාභීන්

රෝහල	බොරැල්ල		යක්කල		කයිතඩ්		ත්‍රිකුණාමලය	
වර්ෂය	2021	2022	2021	2022	2021	2022	2021	2022
ජංගම සායන	Covid 19 වසංගත නිසා සිදු නොකරන ලදි.	2,921	Covid 19 වසංගත නිසා සිදු නොකරන ලදි.	520	317	707	2	2
ප්‍රදර්ශන		-		1	-	580	-	-
දැනුවත් කිරීම්		-		2	-	150	-	2
විශේෂිත සායන		-		-	2996	150	-	395

2.1.6.5 ඖෂධ නිෂ්පාදනය

රෝහල	බොරැල්ල		කයිතඩි		යක්කල		ත්‍රිකුණාමලය	
වර්ෂය	**2021**	**2022**	**2021**	**2022**	**2021**	**2022**	**2021**	**2022**
බෝතල්								
අරිෂ්ඨ	800	-	-	-	128	-	12.475	1.550
ආසව	455	4	-	-	420	128	-	-
තෛල	2,976.5	4,274	2,293.25	1,785.95	1,033.5	993	360	540
සිරප්	300	347	203.25	250	-	-	-	12
ක්වාථ	16,500	5,974	-	-	1,145	1,002	-	-
පාන	-	380	532.19	292.65	-	-	-	-
කෂාය	9,000	11,134	11,607	18,796	5,064	5,631	-	-
වෙනත්	20,544	3,727	-	-	619	433	-	-
අනුපාන (මිලි.ලීටර 60)	1340	77	6,074	13,898	-	-	-	-
පණ්ඩුෂ ද්‍රාවණය	10	-	-	-	-	-	-	-
නේත්‍රා බිංදු	27	19	-	-	03	-	-	-
ගුලි	86.09	8.230	12.57	34.27	-	-	-	-
කල්ක	283.8	240	-	-	-	98.900		-
ලේප	202.219	460	19.22	8.32	206	213.950	-	-
චූර්ණ	4,186	2,902	523.8	537.22	2,429.00	598.620	11.5	11.5
ක්ෂාර	1,324	2.165	-	-	-	-	-	-
පාණ්ඩ	-	198	-	-	2,175.41	1,902.850	-	-
පත්තු	205.3	393	223.86	416.54	81	132.490	-	-
ලේහ	-	-	9.75	12.48	-	-	-	-

ගුග්ගුලු	268.2	166.6	-	-	-	63.130	-	-
තැවිලි	0.6	48	-	-	128.82	423.300	-	-
වටී	76.335	11.2	-	-	-	-	-	-
වර්ති	0.6	0.910	-	-	-	-	-	-
කුඩු	-	1.1	-	-	-	-	-	-
රස බෙහෙත්	29.25	46.313	-	-	-	-	-	-
ශෝධිත ගුගුල්	-	86.3	-	-	-	-	-	-
පංචවල්කල	-	8033	-	-	-	-	-	-
පැලැස්තර	12,400	18	-	-	-	-	-	-
මැල්ලුම්	68	14	-	-	-	-	-	-
වෙනත් (ක්ෂාරසූත්‍ර නූල්)	1,374	1272	-	-	-	-	-	-
යුනානි ඖෂධ	-	-	-	-	-	15.600	-	-
වෙනත්	-	18	18	-	-	-		-

2.1.7 ආයුර්වේද පර්යේෂණ රෝහල්

2.1.7.1 මූලික තොරතුරු

විස්තරය	නාවින්න		අම්පාර		හම්බන්තොට		නින්දවූර්		මැදවච්චිය		මංචන්තෝඩුවායි		මිහින්තලය	
ආරම්භක දිනය	1962.10.14		1990.01.01		2010.02.14		2017.01.28		2017.08.06		2009.12.01		2019.09.29	
වර්ෂය	2021	2022	2021	2022	2021	2022	2021	2022	2021	2022	2021	2022	2021	2022
වාට්ටු ගණන	4	4	2	2	4	4	-	-	2	2	2	2	-	-
ඇඳන් සංඛ්‍යාව	100	68	31	31	102	102	-	-	28	28	29	29	8	12
වෛද්‍යවරුන් ගණන	51	54	7	6	21	20	2	2	5	6	6	6	3	3
හෙද කාර්ය මණ්ඩලය	12	12	5	5	9	9	-	-	5	5	-	-	-	-
අනෙකුත් කාර්ය මණ්ඩලය	66	68	38	39	36	36	4	5	30	29	21	21	3	4

2.1.7.2 රෝගී ප්‍රතිකාර සේවා

රෝහල	නාවින්න		අම්පාර		හම්බන්තොට		නින්දවූර්		මැදවච්චිය		මංචන්තෝඩුවායි		මිහින්තලය	
වර්ෂය	2021	2022	2021	2022	2021	2022	2021	2022	2021	2022	2021	2022	2021	2022
බාහිර	31,037	41,159	18,041	20,138	15,258	17,536	2,547	3,462	5,488	7,247	8,177	10,504	2,600	1,211
නේවාසික	1,061	657	171	193	151	419	-	-	80	162	150	-	-	-
සායන	13,236	24,574	100	18	-	-	-	-	93	-	-	-	78	447
පංචකර්ම	354	921	-	-	-	-	-	-	15	-	-	-	-	-

2.1.7.3 ප්‍රජා සෞඛ්‍ය සත්කාරක සේවා

රෝහල	නාවින්න		අම්පාර		හම්බන්තොට		නින්දවූර්		මැදවච්චිය		මංචන්තෝඩුවායි		මිහින්තලය	
වර්ෂය	2021	2022	2021	2022	2021	2022	2021	2022	2021	2022	2021	2022	2021	2022
ජංගම සායන (ප්‍රතිලාභීන්)	-	-	100	18	152	-	-	6	96	63	-	-	-	-
ප්‍රදර්ශන	-	2	-	-	-	-	-	1	-	-	-	-	-	-
දැනුවත් කිරීම්	1	-	1	-	-	-	-	-	-	1	-	-	-	-
විශේෂිත සායන (ප්‍රතිලාභීන්)	69	-	-	-	-	-	-	-	-	1	-	-	-	-
පුහුණු වැඩසටහන්	10	12	8	-	27	-	-	-	-	1	-	-	-	-

2.1.7.4 ඖෂධ නිෂ්පාදනය

රෝහල	අම්පාර		හම්බන්තොට		මැදවච්චිය		නාවින්න		මංචන්තුඩාව		නින්දවූර්		මිහින්තලය	
වර්ෂය	2021	2022	2021	2022	2021	2022	2021	2022	2021	2022	2021	2022	2021	2022
බෝතල්														
ආසව	-	-	-	-	-	-	1,410	375	-	-	-	-	-	-
තෛල	248	201 3/4	49	-	-	11 අවුන්ස 12	1,442	641	-	-	-	-	-	-
පැණි	-	-	-	-	-	-	54	37	-	-	-	-	-	-
ක්වාථ	40	25	1,525	3,124	-	55	10,240	4980	-	-	-	-	-	-
කෂාය	464.95	540.58	809	668	207	333	4,071.5	3780	-	-	-	-	-	-
අනුපාන	-	-	7	85	133	122	81.43	-	-	-	-	-	-	-
පාන	-	1000	-	-	-	8	20	-	-	-	-	-	-	-
වෙනත් (තැම්බූ වතුර)	-	-	291	240	-	279	42.66	987.56	-	-	-	-	-	-
වෙනත් (ද්‍රව)	-	1	-	-	-	-	1,873.94	-	-	-	-	-	-	-
නේත්‍රා බිංදු	-	-	-	-	-	-	40	45.375		-		-	-	-
කිලෝ ග්‍රෑම්														
ගුලි	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
කල්ක	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
ලේප	250.285	6	-	-	5	0.7	34.25	42.28	-	-	-	-	-	-
චූර්ණ		157.75	64	4.3	-	9.7	1,272.11	1,511.35	-	-	-	-	-	-
පාණ්ඩ	-	36.3	-	-		-	59.6	72.31	-	-	-	-	-	-
පත්තු	-	-	8	7.95	21	19.63	06	5.8	-	-	-	-	-	-
තැවිලි	-	-	25	17.328	38	48.925	04	38.15	-	-	-	-	-	-
වටි	-	-	-		-	-	-	-	-	-	-	-	-	-
වර්ති	-	-	-		-		1,157	1,028	-	-	-	-	-	-
කුඩු	1	-	-		-		2,012.2		-	-	-	-	-	

2.1.8 බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය

2.1.8.1 පර්යේෂණ ප්‍රගතිය - සාහිත්‍ය අංශය

පර්යේෂණ මාතෘකාව	අපේක්ෂිත නිමැවුම	කාල සීමාව වර්ෂය	ප්‍රගතිය (%)	වගකීම/පර්යේෂණ කණ්ඩායම
1.වටිකා ප්‍රකරණයේ සඳහන් බිළිඳුරාජ ගුලිය පිළිබඳ සාහිත්‍යමය විමර්ශනය	පර්යේෂණ පත්‍රිකාවක් ලෙස සැකසීම හා 2020/2021 ආයුර්වේද සමීක්ෂා පර්යේෂණ ජනලයේ පළ කිරීම	2022 සිට 2023 මාර්තු දක්වා	100 %	සාහිත්‍ය පර්යේෂණ අංශය
2.ආයුර්වේද සමීක්ෂා ඉතිහාසය පිළිබඳ සාහිත්‍ය පර්යේෂණය	පර්යේෂණ පත්‍රිකාව සැකසීම, 2020/2021 ආයුර්වේද සමීක්ෂා පර්යේෂණ ජනලය සඳහා ඉදිරිපත් කිරීම හා පර්යේෂණ ජනලයේ පළ කිරීම	2023 මාර්තු සිට 2023 දෙසැම්බර් දක්වා	100 %	සාහිත්‍ය පර්යේෂණ අංශය
3.බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ ඉතිහාසය පිළිබඳ සාහිත්‍ය පර්යේෂණය සිදු කිරීම	පර්යේෂණ පත්‍රිකාව සැකසීම	2023 ජනවාරි සිට 2023 දෙසැම්බර් දක්වා	75%	සාහිත්‍ය පර්යේෂණ අංශය
4.බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ සිදුකල පර්යේෂණ පිළිබඳ සාහිත්‍ය පර්යේෂණය සිදු කිරීම	පර්යේෂණ පත්‍රිකාව සැකසීම	2023 ජනවාරි සිට 2023 දෙසැම්බර් දක්වා	75%	සාහිත්‍ය පර්යේෂණ අංශය
5.A Review of Koladawundaya Receipe and its Application.’	පර්යේෂණ පත්‍රිකාව සැකසීම	2023 පෙබරවාරි	100%	සාහිත්‍ය පර්යේෂණ අංශය හා සීමාවාසික වෛද්‍යවරුන්

පුස්තකාල පහසුකම් සැපයීම		
ක්‍රියාකාරකම්	පහසුකම් සැපයූ ආයතනය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
1. පුස්තකාල පහසුකම් සැපයීම 2. අදාළ දත්ත සෙවීමේ පහසුකම් සැපයීම 3. පර්යේෂණ කටයුතු සඳහා පුස්තකාල සේවා පහසුකම් ලබා දීම 4. සිව්මංසල වැඩසටහන සඳහා දියවැඩියාව, උන්මාද රෝග, ළමා රෝග, විෂ වෙදකම පිළිබඳ අවශ්‍ය තොරතුරු සැපයීම 5. සාහිත්‍ය පර්යේෂණ හා සාහිත්‍ය විමර්ශන කටයුතු සඳහා සහය වීම හා සේවා සැපයුම	ආයතනයේ වෛද්‍යවරුන්	50
6. සාහිත්‍ය පර්යේෂණ කටයුතු පිළිබඳ දැනුවත් කිරීම 7. සාහිත්‍ය පර්යේෂණ පත්‍රිකා සැකසීමට උපදෙස් ලබා දීම 8. සකස්කරනු ලබන පර්යේෂණ පත්‍රිකා අධීක්ෂණය 9. පර්යේෂණ පත්‍රිකා සංරක්ෂණය 10. සාහිත්‍ය පර්යේෂණ අංශය සහ පුස්තකාල භාවිත ක්‍රමවේදය පිළිබඳ සීමාවාසික	සීමාවාසික වෛද්‍යවරුන්	150

පුහුණු වෛද්‍ය නිලධාරීන් දැනුවත් කිරීම. 11. පුස්තකාල පහසුකම් සැපයීම		
12. පුස්තකාල පහසුකම් සැපයීම 13. සාහිත්‍ය පර්යේෂණ හා සාහිත්‍ය විමර්ශන කටයුතු සඳහා සහය වීම හා සේවා සැපයුම	බාහිර පුද්ගලයන් • කැලණිය විශ්ව විද්‍යාලය මගින් සිදුකරන **“ශ්‍රී ලංකාවේ වෛද්‍ය ශාස්ත්‍රය තුළ පිළිබිඹු වන විෂ වෙදකම පිලිබඳ විමර්ශනාත්මක අධ්‍යනයක්”** යන පර්යේෂණයට අවශ්‍ය තොරතුරු සැපයීම • සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය • කොළඹ විශ්ව විද්‍යාලය • ශ්‍රී ජයවර්ධනපුර විශ්වවි ද්‍යාලය • කැලණිය විශ්ව විද්‍යාලය	06

2.1.8.2 පර්යේෂණ ප්‍රගතිය - උද්භිද විද්‍යා අංශය

පර්යේෂණ ක්ෂේත්‍රය	පර්යේෂණ මාතෘකාව	අපේක්ෂිත නිමැවුම	ආරම්භ කල වර්ෂය	ප්‍රගතිය (%)	වගකීම/පර්යේෂණ කණ්ඩායම
වියලි අමුද්‍රව්‍ය හඳුනාගැනීම	අමුද්‍රව්‍ය 12 ක් සඳහා ප්‍රමිති සැකසීම	වඩා ප්‍රමිතියෙන් යුතු අමුද්‍රව්‍ය සැකසීම	2021	75%	සියලු විද්‍යාත්මක නිලධාරීන් /සංවර්ධන නිලධාරීන්
ඖෂධීය ශාක හඳුනාගැනිම	"කිඳ" විශේෂ 7ක් මානව උද්භිද විද්‍යා අධ්‍යනයන් ඇසුරින් ඒවා නිවැරදිව හඳුනාගැනීම	පාරම්පරික වෛද්‍ය විද්‍යාවේදී හමුවෙන කිඳ විශේෂ නිවැරදිව හඳුනාගැනීම.	2021	60%	පුෂ්පා ජීවන්දර බුද්ධිකා එදිරිසුරිය
	දන්ති (Balicspermu mountanum) දැන්ත (Boehmeria niuea) පිළිබඳ වනස්පති විද්‍යාත්මක අධ්‍යනයක්	උසස් ගුණාත්මක භාවයෙන් යුත් ඖෂධ නිෂ්පාදනය	2021	90%	පුෂ්පා ජීවන්දර බුද්ධිකා එදිරිසුරිය
	රත්හදුන් හා එහි ආදේශකයන් නිවැරදිව හඳුනා ගැනීම	උසස් ගුණාත්මක භාවයෙන් යුත් ඖෂධ නිෂ්පාදනය	2022	50%	විශේෂඥ වෛද්‍ය සුපුල් සුමනසිංහ පුෂ්පා ජීවන්දර තමරා නවරත්න
	Lodra (symplocos racemosa) හා ලොත්සුඹුල් (Melaleuca leucoden) ආදේශක පිළිබඳ වනස්පති විද්‍යාත්මක අධ්‍යනයක්	උසස් ගුණාත්මක භාවයෙන් යුත් ඖෂධ නිෂ්පාදනය	2021	90%	විශේෂඥ වෛද්‍ය සුපුල් සුමනසිංහ පුෂ්පා ජීවන්දර තමරා නවරත්න
	Solanum විශේෂවල වනස්පති විද්‍යාත්මක අධ්‍යනයන් *insanum *incanum *melongena *Torvum	උසස් ගුණාත්මක භාවයෙන් යුත් ඖෂධ නිෂ්පාදනය	2021	40%	පුෂ්පා ජීවන්දර බුද්ධිකා එදිරිසුරිය

ඖෂධීය ශාක වගාව හා සංරක්ෂණය	උසස් ගුණාත්මක භාවයෙන් යුතු තිප්පිලි ප්‍රභේද හඳුන්වාදීම	උසස් ප්‍රමිතියෙන් යුත් අමුද්‍රව්‍ය හඳුනා ගැනීම	2021	100%	අවලා ද සිල්වා පුෂ්පා ජීවන්දර තමරා නවරත්න
	දුර්ලභ හා වඳවීමේ තර්ජනයට ලක්ව ඇති ඖෂධීය ශාක පිළිබඳ පටක රෝපණ පර්යේෂණ දුහුල්/එකාවේරිය/රත්නිටුල්/බිනර/බිංකොහොඹ	ඖෂධීය ශාක සංරක්ෂණය	2021 2022	100%	අවලා ද සිල්වා

- **ඖෂධීය අමුද්‍රව්‍ය පරීක්ෂාව**

පර්යේෂණ කාර්යය/පරීක්ෂා කළ අමුද්‍රව්‍ය	දිනය	සේවය ලබාදුන් ආයතනය	
		අභ්‍යන්තර	බාහිර
එලබටු	2021.02.15	අභ්‍යන්තර	
රත්හදුන්	2021.01.24	අභ්‍යන්තර	
ඇටඹ	2021.11.03		බාහිර
වදකහ	2021.01.24	අභ්‍යන්තර	
වැල්මී	2021.01.24	අභ්‍යන්තර	
රත්හදුන්	2021.11.15	අභන්තර	
රත්හදුන්	2022.04.18	අභ්‍යන්තර	
නිල්කටරොළු	2022.01.26		බාහිර
එලගොරකා	2022.01.05		බාහිර
ගදපාන	2022.01.25		බාහිර
කුඹුරු	2022.02.02		බාහිර
නික	2022.02.02		බාහිර
පාවට්ටා	2022.02.02		බාහිර

➢ **ව්‍යාප්ති සේවා**

ව්‍යාප්ති සේවා	සේවාවන් ලබාදුන් ආයතනය/පුද්ගල කණ්ඩායම් හා සංඛ්‍යාව		
	පාසල්	රජයේ ආයතන	වෙනත්
ඖෂධීය ශාක අමුද්‍රව්‍ය නිවැරදිව හඳුනා ගැනීම	-	99	-
ඖෂධීය ශාක නිදර්ශක නිවැරදිව හඳුනා ගැනීම	-	-	131
දැනුවත් කිරීමේ වැඩසටහන්	02	02	-
ප්‍රදර්ශන	02	-	-
වැඩමුළු	-	03	03

2.1.8.3 පර්යේෂණ ප්‍රගතිය - ප්‍රමිතිකරණ අංශය

පර්යේෂණ ක්ෂේත්‍රය	පර්යේෂණ මාතෘකාව	ආරම්භ කල වර්ෂය	ප්‍රගතිය (%)	වගකීම්/පර්යේෂණ කණ්ඩායම
01.	Introducing Natural Immune Boosters, A product development initiative for higher scale manufacturing novel application with scientific rationale	2021		විශේෂඥ වෛද්‍ය වජිර සෙනෙවිරත්න
02.	Quality Assessment of three Ginger varieties grown in Sri Lanka	2021	95%	➢ තමරා නවරත්න (විද්‍යාත්මක නිලධාරී) ➢ සුදීපා සුගතදාස (විද්‍යාඥ- වනස්පති)
03.	Preliminary Comparative Chemical analysis of selected ***Piper sp.***	2021	80%	➢ තමරා නවරත්න (විද්‍යාත්මක නිලධාරී) ➢ අචලා ද සිල්වා (විද්‍යාත්මක නිලධාරී) ➢ උපේක්ෂා ලොකුතොටහේවා (තාක්ෂණ නිලධාරී වැ.ආ)
04.	Comparative Phyto-chemical & TLC study of Lothsumbul & Bombu	2021	80%	➢ තමරා නවරත්න (විද්‍යාත්මක නිලධාරී) ➢ විශේෂඥ වෛද්‍ය සුපුල් සුමනසිංහ

				➢ පුෂ්පා ජීවන්දර (විද්‍යාත්මක නිලධාරී)
05.	Standardization of Dashanga Guggulu	2021	50%	➢ වෛද්‍ය තුෂාරී සේනාරත්න ➢ වෛද්‍ය සුජාතා මල්කාන්ති ➢ තමරා නවරත්න (විද්‍යාත්මක නිලධාරී) ➢ කෞෂලා ජයරත්න (විද්‍යාත්මක නිලධාරී) ➢ උපේක්ෂා ලොකුතොටහේවා (තාක්ෂණ නිලධාරී වැ.ආ) ➢ දේශිකා ගමගේ (තාක්ෂණ නිලධාරී වැ.ආ)
06.	Assessment of Microbial quality of some heavily used powdered herbal drugs prepared in pharmaceutical drug manufacturing unit of BMARI	2021	100%	කෞෂලා ජයරත්න (විද්‍යාත්මක නිලධාරී)
07.	Comparative evaluation of microbiological quality of Tripla choorna, Kwatha & their raw material	2021	90%	➢ වෛද්‍ය ඒ. මනෝරාජ් ➢ කෞෂලා ජයරත්න (විද්‍යාත්මක නිලධාරී)
08.	Determination of microbial contamination of some selected raw materials heavily used in Ayurvedic treatments	2021	75%	කෞෂලා ජයරත්න (විද්‍යාත්මක නිලධාරී)
09.	A Review on Antimicrobial efficacy of family Orchidacea	2021	100%	කෞෂලා ජයරත්න (විද්‍යාත්මක නිලධාරී)
10.	නවරත්න කල්කය රෝගීන්ට ලබා දීම සඳහා නියමිත මාත්‍රාව සහිතව ප්‍රමිතියනුකූල ඇසුරුමක් හඳුන්වා දීම	2022	100%	උපේක්ෂා ලොකුතොටහේවා (තාක්ෂණ නිලධාරී වැ.ආ)

11.	බහුලවම භාවිත කරන තෙල් වර්ග කීපයක් නව මුහුණුවරක් සහිතව රෝගීන්ට පහසුවෙන් භාවිත කළ හැකි නිෂ්පාදන ලෙස (ointment /balm) නිෂ්පාදනය කිරීම (මූලික අධ්‍යයනය)	2022	100%	➢ විශේෂඥ වෛද්‍ය වජිර සෙනෙවිරත්න ➢ වෛද්‍ය තුෂාරී සේනාරත්න ➢ තමරා නවරත්න (විද්‍යාත්මක නිලධාරී) ➢ කෞෂලා ජයරත්න (විද්‍යාත්මක නිලධාරී) ➢ උපේක්ෂා ලොකුතොටහේවා (තාක්ෂණ නිලධාරී වැ.ආ) ➢ දේශිකා ගමගේ (තාක්ෂණ නිලධාරී වැ.ආ) ➢ දේශාන් ඒකනායක (සංවර්ධන නිලධාරී)
12.	තාලිසාදී චූර්ණය 'සැපිය හැකි (chewable) පෙත්තක් ' ලෙස නිෂ්පාදනය කිරීම (මූලික අධ්‍යයනය)	2022	100%	විශේෂඥ වෛද්‍ය වජිර සෙනෙවිරත්න

➢ **ප්‍රමිතිකරණ සේවා**

සේවා සැපයූ ක්ෂේත්‍රය	සේවය ලබාදුන් ආයතනය	
	අභ්‍යන්තර	බාහිර
Imported Crushed Plant Wastes – Declared as Whole Coriander- පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීම. (2021)		ශ්‍රී ලංකා රේගුව
අබ තෙල් සහ තල තෙල් සඳහා පරීක්ෂණ වාර්තාවක් ලබා දීම. (2021)		බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල
ඉදිරිපත් කල පහත ටෙන්ඩර සාම්පල සඳහා පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම තල තෙල් (05), එළඟි තෙල් (04), ටර්පන්ටයිල් තෙල් (05), මී පැණි (05) (2021)		සබරගමු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව
කොවිඩ් රෝගය සඳහා නිෂ්පාදිත ඖෂධ - පරීක්ෂණ වාර්තාවක් ලබා දීම. (2021)		පාරම්පරික දේශීය වෛද්‍යවරුන්

සහිඳ ලුණු - පරීක්ෂණ වාර්තාවක් ලබා දීම.		ශිල්පිය අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව
සුවධරණි ප්‍රතිශක්ති වර්ධක පානය, සුවධරණි කැඳ, ගුඩුච්චියාදී චූර්ණය (විවිධ නිෂ්පාදනාගාර මඟින් සාම්පල 08) (2021)		ශිල්පිය අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව
තල තෙල් , කොහොඹ තෙල් - පරීක්ෂණ වාර්තාවක් ලබා දීම. (2022)		යක්කල ආයුර්වේද රෝහල
Imported Crushed Plant wastes – Declared as Whole Coriander- පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීම. (2021)		බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල
අබ තෙල් සහ තල තෙල් සඳහා පරීක්ෂණ වාර්තාවක් ලබා දීම. (2021)		ශිල්පිය අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව
ඉදිරිපත් කළ පහත ටෙන්ඩර සාම්පල සඳහා පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම තල තෙල් (05), එළඟි තෙල් (04), ටර්පන්ටයිල් තෙල් (05), මී පැණි (05) (2021)	ගබඩාව , ආයුර්වේද පර්යේෂණායතනය	
කොවිඩ් රෝගය සඳහා නිෂ්පාදිත ඖෂධ - පරීක්ෂණ වාර්තාවක් ලබා දීම. (2021)	ඖෂධ නිෂ්පාදනාගාරය, ආයුර්වේද පර්යේෂණායතනය	
සහිඳ ලුණු - පරීක්ෂණ වාර්තාවක් ලබා දීම.	ප්‍රා. පු වෛද්‍ය	
සුවධරණි ප්‍රතිශක්ති වර්ධක පානය, සුවධරණි කැඳ, ගුඩුච්චියාදී චූර්ණය (විවිධ නිෂ්පාදනාගාර මඟින් සාම්පල 08) (2021)		සබරගමුව පළාත් ආයුර්වේද රෝහල
තල තෙල් , කොහොඹ තෙල් - පරීක්ෂණ වාර්තාවක් ලබා දීම. (2022)		බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල
Imported Crushed Plant wastes – Declared as Whole Coriander- පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීම. (2021)		ශ්‍රී ලංකා රේගුව
අබ තෙල් සහ තල තෙල් සඳහා පරීක්ෂණ වාර්තාවක් ලබා දීම. (2021)		බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල
තල තෙල් , කොහොඹ තෙල් - පරීක්ෂණ වාර්තාවක් ලබා දීම(2022)		සබරගමු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව
ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් ඉදිරිපත් කළ පහත ටෙන්ඩර සාම්පල සඳහා පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම.		පාරම්පරික දේශීය වෛද්‍යවරුන්

තල තෙල් (02), කොහොඹ තෙල්(03) (2022)		
පහත සාම්පල සඳහා පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම. (2022) තල තෙල් - 08 ටර්පන්ටයින් තෙල් - 05 අබ තෙල් - 04 මී පැණි - 03		ශිල්පීය අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව
පිප්පල්‍යද්‍යසවය - සාම්පල සඳහා පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම (2022)		ශිල්පීය අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව
මී පැණි - සාම්පල සඳහා පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම (2022)		යක්කල ආයුර්වේද රෝහල
මී පැණි - සාම්පල සඳහා පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම (2022)		බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල
කොත්තමල්ලි - සාම්පල සඳහා පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම (2022)		ශිල්පීය අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව
සාම්පල 53ක් සඳහා ක්ෂුද්‍ර ජීවී පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම. (2021)	ගබඩාව , ආයුර්වේද පර්යේෂණායතනය	
සාම්පල 79 ක් සඳහා ක්ෂුද්‍ර ජීවී පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම. (2022)	ඖෂධ නිෂ්පාදනාගාරය, ආයුර්වේද පර්යේෂණායතනය	
තල තෙල් , කොහොඹ තෙල් - පරීක්ෂණ වාර්තාවක් ලබා දීම(2022)	ප්‍රා. පු වෛද්‍ය	
ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් ඉදිරිපත් කළ පහත ටෙන්ඩර සාම්පල සඳහා පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම. තල තෙල් (02), කොහොඹ තෙල්(03) (2022)		සබරගමුව පළාත් ආයුර්වේද රෝහල
පහත සාම්පල සඳහා පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම. (2022) තල තෙල් - 08 ටර්පන්ටයින් තෙල් - 05 අබ තෙල් - 04 මී පැණි - 03		බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල

පිප්පල්‍යද්‍යසවය - සාම්පල සඳහා පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම (2022)		ශ්‍රී ලංකා රේගුව
මී පැණි - සාම්පල සඳහා පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම (2022)		බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල
මී පැණි - සාම්පල සඳහා පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම (2022)		සබරගමු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව
කොත්තමල්ලි - සාම්පල සඳහා පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම (2022)		පාරම්පරික දේශීය වෛද්‍යවරුන්
සාම්පල 53ක් සඳහා ක්ෂුද්‍ර ජීවී පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම. (2021)		ශිල්පීය අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව
සාම්පල 79 ක් සඳහා ක්ෂුද්‍ර ජීවී පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම. (2022)		ශිල්පීය අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව
මී පැණි - සාම්පල සඳහා පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම (2022)		යක්කල ආයුර්වේද රෝහල
කොත්තමල්ලි - සාම්පල සඳහා පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම (2022)		බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල
සාම්පල 53ක් සඳහා ක්ෂුද්‍ර ජීවී පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම. (2021)	අයුර්වේද පර්යේෂණ ආයතනය, ශ්‍රී ලංකා රේගුව, ආයුර්වේද දෙපාර්තමේන්තුව	
සාම්පල 79 ක් සඳහා ක්ෂුද්‍ර ජීවී පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම. (2022)	ආයුර්වේද පර්යේෂණ ආයතනය, බොරැල්ල, ආයුර්වේද ශික්ෂණ රෝහල, ආයුර්වේද දෙපාර්තමේන්තුව	

- **ව්‍යාපෘති සේවා - දැනුවත් කිරීමේ වැඩසටහන්**

ව්‍යාප්ති සේවා	විස්තරය	සේවාව ලබාදුන් ආයතනය/කණ්ඩායම
පුහුණු වැඩසටහන - දින 10	Training on Laboratory Techniques for Senior Medical officers	ආයුර්වේද පර්යේෂණායතනයේ වෛද්‍ය නිලධාරීන් 05 දෙනෙකු සඳහා
දැනුවත් කිරීමේ වැඩසටහන	Conducted webinar session on “Need analysis of Total Quality Management”	ක්ෂේත්‍රයේ නිරතවන්නන් සහ ඒ පිලිබඳ උනන්දුවක් ඇති අය දැනුවත් කිරීම.
පුහුණු වැඩසටහන - සති 3	Conducting an industrial training program for students of University of Sri Jayewardenepura	ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂක සිසුන් සඳහා
පුහුණු වැඩසටහන	Training for under graduate students of IIM	උපාධි අපේක්ෂක සිසුන්, දේශීය වෛද්‍ය ආයතනය
අත්පත්‍රිකාවක් පිළියෙළ කිරීම	ක්ෂුද්‍රජීවී විද්‍යාගාරයේ සිදුකරන ප්‍රධාන කාර්යයන් සහ එහි වැදගත්කම පිළිබඳව	ක්ෂේත්‍රයේ නිරතවන්නන් සහ ඒ පිලිබඳ උනන්දුවක් ඇති අය දැනුවත් කිරීම.
ක්ෂුද්‍රජීවී තත්ව නීර්ණය සඳහා අවශ්‍ය සම්මත මෙහෙයුම් ක්‍රමවේදය (SOP) සකස් කිරීම	ක්ෂුද්‍රජීවී විද්‍යාගාරය තුළ අනුගමනය කළයුතු සම්මත මෙහෙයුම් ක්‍රමවේදය WHO මාර්ගෝපදේශ වලට අදාළව සකස් කිරීම	ආයුර්වේද පර්යේෂණායතනය

2.1.8.4 පර්යේෂණ ප්‍රගතිය - සායන අංශය

පර්යේෂණ ක්ෂේත්‍රය	පර්යේෂණ මාතෘකාව	අපේක්ෂිත නිමැවුම	ආරම්භ කල වර්ෂය	ප්‍රගතිය (%)	වගකීම/පර්යේෂණ කණ්ඩායම
සායන අංශය	මේද වෘද්ධි රෝගය සඳහා ආයුර්වේද ඖෂධවල සාපල්‍යතාවය සෙවීම.	මේද වෘද්ධි රෝගය සඳහා ඖෂධ නිපදවීම.	2021	25%	➢ මහාචාර්ය කමල් පෙරේරා ➢ වෛද්‍ය ඉනෝකා කුමාරසිංහ ➢ වෛද්‍ය තුෂාරි සේනාරත්න ➢ වෛද්‍ය ක්‍රිෂලෝජන්
Drug Research	In-vitro anti-glyacation activity and anti-oxidant activity of medicinal formulae in Ayurveda which used to treat diabetic mellitus		2017	25%	➢ ආචාර්ය ඩබ්. කුඹුක්ගොල්ල ➢ වෛද්‍ය රුවිනි මෙන්ඩිස් ➢ වෛද්‍ය සම්පත් අත්තනායක ➢ වෛද්‍ය පුෂ්පා කාහිංගල ➢ වෛද්‍ය වසන්තා වීරපාන ➢ තමරා නවරත්න (විද්‍යාත්මක නිලධාරී)

2.1.9 ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය - අනුරාධපුරය

ව්‍යාපෘතිය/ වැඩසටහන	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
	2022	**2022**
බෝ නොවන රෝග පාලනය	2,410	39,825
බෝ වන රෝග පාලන වැඩසටහන්	2,706	43,463
ප්‍රජා මූලික වැඩිහිටි සෞඛ්‍ය සේවා වැඩසටහන/සායන	360 (සායන)	25,320
පාසල් වැඩසටහන්	230	11,258
ළමා සෞඛ්‍ය සංරක්ෂණ	1,734	31,982
වෘත්තීය සෞඛ්‍ය වැඩසටහන්	85	1,738
මාතෘ සංරක්ෂණ වැඩසටහන්	34	320
මානසික සෞඛ්‍ය වැඩසටහන්	58	899
ගෘහ ඒකක දැනුවත් කිරීම	ගෘහ ඒකක 65,126	162,432
ඖෂධ පැලෑටි සංරක්ෂණය හා තිරසාර භාවිතය	407	6,726
දේශීය ආහාර ප්‍රචලිත කිරීම (හෙළ අහරින් සුවය රකිමු) - පොෂණ වැඩසටහන්	1,821	25,004
වෙනත් වැඩසටහන්	528	10,752
2022 වර්ෂයේදී සිදු කරන ලද මුළු වැඩසටහන් සංඛ්‍යාව හා ප්‍රතිලාභීන් සංඛ්‍යාව	**75,499**	**359,719**
2021 වර්ෂයේදී සිදු කරන ලද මුළු වැඩසටහන් සංඛ්‍යාව හා ප්‍රතිලාභීන් සංඛ්‍යාව	**90,013**	**345,806**

2.1.10 දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය

2.1.10.1 පුහුණු වැඩසටහන්

වෛද්‍ය නිලධාරී පුහුණු වැඩසටහන්

අනු අංකය	වැඩසටහන/ව්‍යාපෘතිය/ ක්‍රියාකාරකම	ප්‍රගතිය	ඇස්තමේන්තු ගත මුදල	පිරිවැය
01	සීමාවාසික වෛද්‍ය පුහුණුවට අදාළ මාර්ගෝපදේශ සංග්‍රහයේ නිරීක්ෂණ ලබා දීමේ වැඩමුළුව (2022.01.10/13/20 දිනයන්)	ආයුර්වේද කොමසාරිස්, පළාත් කොමසාරිස්වරු, රෝහල් අධ්‍යක්ෂකවරු හා දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ හා වෛද්‍ය නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සිදු කරන ලදි.	33,955.00	33,955.00
02	සීමාවාසික වෛද්‍ය පුහුණුව (ආරම්භක) සමාරම්භක උත්සවය හා පුහුණු වැඩසටහන (2022.02.01 – 2022.02.09)	සීමාවාසික වෛද්‍ය නිලධාරීන් 256 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන පවත්වන ලදි.	580,600.00	319,078.62
03	සීමාවාසික වෛද්‍ය පුහුණුව (අවසාන) වැඩසටහන (2022.02.28 – 2022.03.07)	වෛද්‍ය නිලධාරීන් 28 දෙනෙකු දැනුවත් කිරීම සිදු කෙරෙමින් පවතී.	81,670.00	53,122.00
04	සීමාවාසික වෛද්‍ය නිලධාරී පුහුණු අත්පොත සමාලෝචනය කිරීමේ වැඩමුළුව (2022.04.29)	දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ නිලධාරීන් විසින් සමාලෝචන කටයුතු සිදු කරන ලදි.	-	-
05	මධ්‍යම රජයේ ආයතන ප්‍රධානී කළමනාකරණ පුහුණු වැඩසටහන-(මාර්ගගත ක්‍රමය)(2022.06.15-2022.06.17)	වෛද්‍ය නිලධාරීන් 90 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන පවත්වන ලදි.	28,250.00	-
06	උතුර හා නැගෙනහිර හැර අනෙකුත් පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවලට අයත් ආයතන ප්‍රධානීන් සඳහා ඵලදායීතාව ඉහළ නැංවීමේ පුහුණු වැඩසටහන (2022.09.21-2022.09.23)	ආයතන ප්‍රධානීන් 70 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන පවත්වන ලදි.	-	මූල්‍ය වියදමක් නැත.zoom තාක්ෂණය ඔස්සේ වැඩසටහන පවත්වන ලදි.
07	සීමාවාසික වෛද්‍ය පුහුණු ආරම්භක පුහුණු ආරම්භක වැඩසටහන (2022.07.01 හා 2022.07.04 - 2022.07.08)	සීමාවාසික වෛද්‍ය නිලධාරීන් 64 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන පවත්වන ලදි.	52,480.00	27,796.00
08	Programme on Contribution of the Ayurveda Health System to achieving sustainable health (from 2022.08.05 15 days.)		62,600.00	43,200.00
	එකතුව		**839,555.00**	**477,908.82**

හෙද හා වෛද්‍ය සහාය කාර්ය මණ්ඩල හා වෙනත් පුහුණු වැඩසටහන්

අනු අංකය	වැඩසටහන/ව්‍යාපෘතිය/ ක්‍රියාකාරකම	ප්‍රගතිය	ඇස්තමේන්තුගත මුදල	පිරිවැය
01	පෞද්ගලික ආයුර්වේද සම්භාහන වැඩමුළුව	සම්භාහනකරුවන් 27 දෙනෙකු පුහුණු කරමින් සිටී.	1,240,000.00	44,862.73
02	ඖෂධ උද්‍යාන සැකසීමේ දැනුම සංවර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන	ඖෂධ උයන් හා ඒ ආශ්‍රිත සේවකයින් 54 දෙනෙකු පුහුණු කරන ලදි.	11,760.00	2,730.00
03	ත්‍රෛයිමාසික ඖෂධ සංයෝජක පුහුණු වැඩසටහන (2022.04.09-2022.06.28) - දමිළ මාධ්‍ය	ඖෂධ සංයෝජකවරුන් 30 දෙනෙකු පුහුණු කරන ලදි.	675,100.00	306,267.00
04	පෞද්ගලික ආයුර්වේද සම්භාහන පාඨමාලාව-NVQ මට්ටම ලබා ගැනීම		295,000.00	-
05	ආයුර්වේද හෙද පුහුණු පාඨමාලාව සකස් කිරීම	සම්පත්දායකයින් 10 දෙනෙකු යොදාගෙන විෂය නිර්දේශය සකස් කරන ලදි.	339,000.00	47,355.00
06	දකුණු පළාත් ඖෂධ සංයෝජක පුහුණු වැඩසටහන මෙම ආයතනයේ මෙහෙයවීමෙන් හා අධීක්ෂණය යටතේ (දින 65ක කාලයක් සඳහා) දකුණු පළාත් මූල්‍ය ප්‍රතිපාදන මඟින් 2022.09.20 සිට 2023 මාර්තු දක්වා පැවැත්වේ.	ඖෂධ සංයෝජකවරුන් 35 දෙනෙකු පුහුණු කරමින් සිටී.		
එකතුව			**2,560,860.00**	**401,214.73**

පාරම්පරික වෛද්‍ය පුහුණු වැඩසටහන් (220-02-04-2401)

අනු අංකය	වැඩසටහන/ ව්‍යාපෘතිය/ ක්‍රියාකාරකම	ප්‍රගතිය	ඇස්තමේන්තු ගත මුදල	පිරිවැය
01	නවක ලියාපදිංචි පාරම්පරික වෛද්‍යවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 03ක් (2022.02022.7.25-2022.07.28, 2022.08.01-022.08.04, 2022.08.15-2022.08.18)	නවක ලියාපදිංචි පාරම්පරික වෛද්‍යවරුන් 178 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදි.	57,000.00	44,200.00
එකතුව			**57,000.00**	**44,200.00**

ප්‍රජා සෞඛ්‍ය මාතෘ හා ළමා පෝෂණ පුහුණු අංශය (220-02-04-2401)

අනු අංකය	වැඩසටහන/ව්‍යාපෘතිය/ක්‍රියාකාරකම	ප්‍රගතිය	ඇස්තමේන්තු ගත මුදල	පිරිවැය
01	මාතෘ පෝෂණ වැඩසටහන (පුහුණුකරුවන් පුහුණු කිරීම- බස්නාහිර පළාත 2022.04.05-2022.04.08)	ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් 30 දෙනෙකු දැනුවත් කරන ලදි.	41,600.00	33,633.00
02	ප්‍රජා සෞඛ්‍ය මාතෘ හා ළමා පෝෂණ මාර්ගෝපදේශ අත්පොත නිර්මාණය කිරීමේ වැඩමුළුව (2022.07.12)	බාහිර සම්පත්දායකයින් 45 දෙනෙකු හා ආයතනයේ වෛද්‍ය නිලධාරීන් 4 දෙනෙකුගේ සහභාගීත්වයෙන් අත් පොත් නිර්මාණ වැමුඩළුවක් සිදු කරන ලදි.	19,000.00	4,200.00
එකතුව			**60,600.00**	**37,833.00**

පුහුණු වැඩසටහන් වලට අදාළ අනෙකුත් කාර්යයන් (220-02-04-2401)

අනු අංකය	වැඩසටහන/ ව්‍යාපෘතිය/ ක්‍රියාකාරකම	ප්‍රගතිය	ඇස්තමේන්තු ගත මුදල	පිරිවැය
01	සම්පත්දායක සංචිතය යාවත්කාලීන කිරීම සඳහා පුවත්පත් දැන්වීමක් පළ කිරීම	ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් 30 දෙනෙකු දැනුවත් කරන ලදි.	48,412.00	48,412.00
2401 වැය විෂය යටතේ මුළු වියදම			48,412.00	**1,324,886.04**

2.1.10.2 **ලබාගෙන ඇති ජයග්‍රහණ**

1. අනුරාධපුර ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවයේ ඵලදායීතාවය ඉහළ නැංවීමට අවශ්‍ය පියවර ගැනීම. ඒ යටතේ;
   I. ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අනුමත කරවා ගැනීම.
   II. ප්‍රගතිය අධීක්ෂණයට අදාළ අභ්‍යන්තර පාලන ක්‍රමවේද සකස් කිරීම.
   III. එම ප්‍රගතිය ළඟා කර ගැනීමට අත්‍යවශ්‍ය පහසුකම් සැපයීම සිදු කරන ලදි.

2. සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය තුළ ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණය සඳහා ජාතික මට්ටමින් ප්‍රතිපත්තියක් කෙටුම්පත් කිරීමේ කටයුතු මේ වන විට ඉටු කරමින් පවතින අතර 2023 වසර තුළ අවසන් කිරීමට අපේක්ෂා කරනු ලබයි.
3. ජාතික වැඩසටහනක් ලෙස මාතෘ සහ ළමා පෝෂණ වැඩසටහන පළාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීම.
   මේ යටතේ පසුගිය වසර තුළ පළාත් වැඩසටහන් 03ක් අවසන් කළ අතර මෙම වසර තුළ ඉතිරි පළාත් 06ක වැඩසටහන් සිදු කරමින් පවතී.
4. මාතෘ සෞඛ්‍ය සංවර්ධනය සඳහා අවශ්‍ය මඟ පෙන්වීම වෛද්‍යවරුන් වෙත ලබා දීමට මාර්ගෝපදේශ අත් පොත සකස් කර වෛද්‍යවරුන් වෙත යොමු කිරීම. එහි දමිළ මාධ්‍ය අත්පොත ද මේ වන විට අවසන් අදියරෙහි පවතී. ළදරු පෝෂණය සහ ළදරු සෞඛ්‍ය සංවර්ධනය සඳහා අවශ්‍ය මඟ පෙන්වීම වෛද්‍යවරුන් වෙත ලබා දීමට මාර්ගෝපදේශ අත් පොත සකස් කරමින් පවතී. මෙම වසර තුළ අවසන් කිරීමට අපේක්ෂිත වේ.
5. සියළුම ශික්ෂණ රෝහල් ප්‍රධානීන්ගේ සහ පළාත් කොමසාරිස්වරුන්ගේ දායකත්වය ඇතිව, සහභාගී ප්‍රවේශයක් ඔස්සේ නව මාර්ගෝපදේශ යටතේ සීමාවාසික පුහුණුව පැවැත්වීමට සැලසුම් කරන ලදි. මේ වන විට සීමාවාසික වෛද්‍යවරුන් 321 දෙනෙකු දිවයින පුරා පිහිටි පුහුණු මධ්‍යස්ථාන 13කට අනුයුක්ත කර මෙම සීමාවාසික පුහුණුව සාර්ථකව ඉටු කිරීමට හැකි වීම මෙම ආයතනය ලද සුවිශේෂී ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකිය.
   එමෙන්ම ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලය සමඟ ඒකාබද්ධව යක්කල ආයුර්වේද ශික්ෂණ රෝහල තුළ පැන නැඟී තිබූ ප්‍රායෝගික ගැටළු විසඳා වඩාත් ඵලදායී ලෙස මෙම පුහුණුව පැවැත්වීමට අවශ්‍ය කටයුතු සංවිධානය කරන ලදි.
   එහිදී නව මාර්ගෝපදේශ යටතේ සීමාවාසික පුහුණුව අධීක්ෂණය සඳහා පාලන ක්‍රමවේදයක් ලෙස නව ලොග් පොත නිර්මාණය කරන ලදි. එමෙන්ම පළාත් මට්ටමින් මෙම පුහුණුව පිළිබඳ පසුවිපරම් හා සමාලෝචන සැසි පවත්වා නව අදහස් හා යෝජනා ලබාගෙන මෙම පුහුණුවට අදාළ ප්‍රායෝගික අභියෝග අවම කිරීමට කටයුතු කර ඇත.

6. මෙම ක්ෂේත්‍රයෙහි ප්‍රථමවරට ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් පුහුණු පාඨමාලාවක් ප්‍රතිපාදනය කිරීමට හැකි වීම අප ආයතනය ලද ජයග්‍රහණයකි. මේ යටතේ 2016 වසරේ සිට ආරම්භ කර තිබූ පෞද්ගලික ආයුර්වේද සමබාහන සහතික පත්‍ර පුහුණු පාඨමාලාව සඳහා ජාතික වෘත්තීය නිපුණතා මට්ටම ලබා ගැනීමේ ප්‍රතිපාදනය කටයුතු අවසාන අදියර දක්වා ගෙන ඒමට හැකි විය. එම කටයුතු මේ වසර තුළ අවසන් කිරීමට නියමිත වේ.
7. හෙද නිලධාරීන්ගේ සමාරම්භක පුහුණුව සඳහා ප්‍රථම වරට සිංහල හා දමිළ මාධ්‍ය දෙකෙන්ම මොඩියුලයක් නිර්මාණය කරන ලද අතර නව වර්ෂයේ ජනවාරි මස මෙම වැඩසටහන ආරම්භ කිරීමට නියමිත වේ.
8. අඛණ්ඩ වෛද්‍ය අධ්‍යාපනය වෙනුවෙන් දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය ප්‍රතිසංවිධානය කිරීමේ කටයුතු සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය වෙත ව්‍යාපෘති යෝජනා සකස් කරමින් පවතින අතර එය මෙම වසර තුළ ලෝක සෞඛ්‍ය සංවිධානය වෙත යොමු කිරීමට නියමිත වේ.

9. මෙම ආයතනය ස්ථාපිත කිරීමේ අරමුණු හා කාලීන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනයෙහි දැක්ම, මෙහෙවර, අරමුණු, ඉලක්ක හඳුනාගනිමින් ප්‍රධාන සැලසුම් සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.
10. දේශීය දැනුම තවදුරටත් ජනගත කිරීම සඳහා වෙබ් අඩවි, you tube චැනල හා Facebook පිටු නිර්මාණය කරමින් පවතී. එමෙන්ම ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් අත්බෙහෙත් හා ඒ සඳහා යොදා ගන්නා පැලෑටි පිළිබඳ අත්පත්‍රිකා ද සකස් කර ජනගත කරමින් පවතී. මේ වන විට අත්පත්‍රිකා 09ක් ප්‍රචලිත කර ඇත.
11. පවතින අවිනිශ්චිත වෙළෙඳපොළ තත්ත්ව යටතේ වුවද අප ආයතනයෙහි ඵලදායීතාවය ඉහළ නැංවීමට අත්‍යාවශ්‍යව පැවැති UPS සමඟ පරිගණක 10ක් මිලදි ගැනීමටත් ආයතනයෙහි පැවැති සියළු පරිගණක හා ආශ්‍රිත උපකරණ අළුත්වැඩියා කර තවදුරටත් භාවිතයට ගැනීමටත් හැකි විය.
12. ව්‍යාවසායකත්වය ඉහළ නැංවීමට ආයුර්වේද රූපලාවන්‍ය පාඨමාලා මුදල් අයකිරීමේ පදනම මත ආරම්භ කිරීමට කටයුතු සිදු කරමින් පවතී.
13. වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයෙහි සම්පත්දායක සංචිතය යාවත්කාලීන කර පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පවත්වා තවදුරටත් ඵලදායීලෙස ධාරිතා සංවර්ධන කටයුතු ඉටු කිරීමට කටයුතු ඉටු කරමින් පවතී.
14. වඩාත් ගුණාත්මක ඉලෙක්ට්‍රොනික සහතිකපත්‍රයක් මෙම ආයතනයෙහි පුහුණුවීම්වලදී නිකුත් කිරීමට කටයුතු කරමින් පවතී.
15. ක්ෂේත්‍රයෙහි පවතින ඉදිරි පුහුණු අවශ්‍යතා කැඳවන ලද අතර ඒ අනුව පුහුණුවීම් සැලසුම් කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී.

- Module 1
  How Young people can manage low mood a depression after covid 19, through Ayurveda perspective ව්‍යාපෘතිය ඉදිරිපත් කර ඇත.
- Module 2
  Quality Herbal drug and cosmetics Manufacturing and value addition techniques, coll abarative programme ඉදිරිපත් කර ඇත.

2.1.11 පර්යේෂණ හා ව්‍යාප්ති සේවා ඔසු උයන්

2.1.11.1 ඔසු පැළ අලෙවි කාර්යයන්

ඔසු උයන	2021			2022		
	නිෂ්පාදනය කළ පැල ප්‍රමාණය	පැල අලෙවිය		නිෂ්පාදනය කළ පැල ප්‍රමාණය	පැල අලෙවිය	
		පැළ ප්‍රමාණය	වටිනාකම (රු.)		පැළ ප්‍රමාණය	වටිනාකම (රු.)
පින්නදූව	11,018	3,998	144,695	11,862	5,558	214,215.00
පට්ටිපොළ	7,594	2,865	97,190	6,510	1,601	64,610.00
පල්ලෙකැලේ	7,690	4,872	157,710	10,465	2,903	97,330.00
හල්දුම්මුල්ල	20,333	8,970	744,120	7,200	5,418	246,050.00
නාවින්න	4,700	5,646	199,280	5,423	5,878	200,370.00
ගිරාඳුරුකෝට්ටේ	15,534	628	25,640	25,506	1,534	60,530.00
එකතුව	**66,869**	**26,979**	**1,368,635**	**66,966**	**22,892**	**883,105.00**

2.1.11.2 නොමිලේ පැළ නිකුත් කිරීම් / ඔසු උයන් අතර පැළ හුවමාරු කිරීම්

ඔසු උයන	2021		2022	
	ප්‍රමාණය	වටිනාකම (රු.)	ප්‍රමාණය	වටිනාකම (රු.)
පින්නදූව	1,485	48,910	175	5,370.00
පට්ටිපොළ	270	8,500	710	21,300.00
පල්ලෙකැලේ	1,293	39,110	1,210	36,300.00
ගිරාඳුරුකෝට්ටේ	37	1,110	2,330	75,750.00
නාවින්න	2,406	77,550	1,353	49,220.00
හල්දුම්මුල්ල	1,035	37,090	1,646	44,750.00
එකතුව	**6,526**	**212,270**	**7,424**	**232,690.00**

2.2 ඉදිරි ඉලක්ක හා අභියෝග

1. ජාතික සෞඛ්‍ය පද්ධතිය තුළ වැඩි දායකත්වයක් ලබා දීම සඳහා ආයුර්වේද රෝහල් පද්ධතිය ගුණාත්මකව සංවර්ධනය කිරීම.
2. ආදායම් උත්පාදනය සඳහා දේශීය වෛද්‍ය ව්‍යවසායකත්ව සංවර්ධනය පුළුල් කිරීම.
3. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ නිෂ්පාදන අපනයනය සඳහා පහසුකම් පුළුල් කිරීම.
4. විදේශයන්ගෙන් ආනයනය කරනු ලබන ඖෂධ මෙරට වගාකිරීම තුළින් ඔසු වෙළඳපොළ සුලභ කිරීම.
5. පාරම්පරික වෛද්‍යවරුන් සඳහා දායක විශ්‍රාම වැටුප් ක්‍රමය සක්‍රීය කිරීම.
6. පාරම්පරික හා ආයුර්වේද වෛද්‍ය ක්‍රමය මඟින් සුව කළ හැකි පහත සඳහන් විශේෂිත රෝග සඳහා පවතින ආයුර්වේද රෝහල් 7ක් අංගසම්පූර්ණ විශේෂිත රෝහල් ලෙස වැඩිදියුණු කිරීම (ආඝාත රෝගය / විශේෂිත ස්නායු රෝග, සන්ධි රෝග, අර්ශස් / භගන්දරා, හග්න (කැඩුම් බිඳුම්), අක්ෂි රෝග, දැවුම් පිලිස්සුම්, චර්ම රෝග).
7. වැඩිහිටි සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ක්‍රමවේදයක් සැකසීම.
8. ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම.
9. අවම වශයෙන් පළාතකට එක් ගෙවන වාට්ටු පහසුකම් සහිත ආයුර්වේද රෝහලක් බැගින් ඇති කිරීම.
10. "හරිතකී" නගර ඔසු වන වැඩසටහන යටතේ ඔසු වන වගා භූමි 500ක් බිහි කිරීම.
11. රටේ සංවර්ධනය සඳහා දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයෙන් ලබා දෙන දායකත්වය මැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම.
12. දිස්ත්‍රික්කයකට අවම වශයෙන් එක් හෝමියෝපති සායනයක් බැගින් ඇති කර ජනතාව තුළ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත කිරීම.
13. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා රක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දීම.
14. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය මඟින් ලබා දෙන සේවා හා නිෂ්පාදන වැඩි දියුණු කිරීම සඳහා ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම.
15. අන්තර් ජාතික මට්ටමේ සමුළුවක් හා ප්‍රදර්ශණයක් පැවැත්වීම.
16. රජයේ ඉඩම් ලබාගෙන නව ඔසු උයන් 03ක් ආරම්භ කිරීම.
17. ආයුර්වේද සංරක්ෂණ සහා සමඟ ඒකාබද්ධ මී පැණි නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම.
18. සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම ඇතුළත් අන්තර්ජාතික වෛද්‍ය කලාපයක් ඇති කිරීම.
19. නිෂ්පාදන අපනයනය කිරීම සඳහා දිරිගැන්වීම.

2.3 අභියෝග

1. ජාතික සෞඛ්‍ය පද්ධතිය තුළ දේශීය වෛද්‍ය අංශයෙන් ඉටුකරනු ලබන කාර්යභාරය පිළිඹිබු නොවීම.
2. වාර්ෂිකව වෙන්වන ප්‍රතිපාදන මත සැලසුම්කර ඇති ඉලක්ක වෙත ළඟා වීමට ඇති නොහැකියාව.

3. පරිච්ඡේදය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

		ඒසීඒ -සී
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය		
	2022 රු.	**2021** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම	79,545,245	75,762,029
අග්‍රිම ලැබීම්	1,659,138,000	2,006,012,000
අත්තිකාරම් අයකර ගැනීම්	36,614,389	36,130,902
තැන්පතු ලැබීම්	14,488,542	19,435,281
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,789,786,176**	**2,137,340,212**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,672,127,348	1,722,091,146
සහනාධාර සහ මාරුකිරීම්	13,007,535	13,052,680
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	39,103,006	4,103,002
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	0	10,700,219
අත්තිකාරම් ගෙවීම්	31,179,573	48,729,370
තැන්පතු ගෙවීම්	16,754,434	20,561,899
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,772,171,897**	**1,819,238,316**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**17,614,279**	**318,101,896**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	17,614,279	318,101,896
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**17,614,279**	**318,101,896**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(17,614,279)**	**(318,101,896)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) +(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.2 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ-එෆ්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා


මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022		සටහන	තත්‍ය 2022	2021	
රු.			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	**ඒසිඒ-1**
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		1,659,138,000	2,006,012,000	**ඒසිඒ-3**
-	නැන්පතු		14,488,542	19,435,281	**ඒසිඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		41,935,404	38,613,385	**ඒසිඒ-5**
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**1,715,561,946**	**2,064,060,666**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**1,715,561,946**	**2,064,060,666**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ(ඇ)		**-**	**10,700,219**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ= (ඇ)-(ඇ)		**1,715,561,946**	**2,053,360,447**	
	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**				
1,541,581,200	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	1,500,015,234	1,425,143,210	
368,062,690	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	326,183,321	431,008,503	**ඒසිඒ-2(ii)**
14,400,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	13,007,535	13,052,680	
-	පොළී ගෙවීම්	**8**		-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
1,924,043,890	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**1,839,206,090**	**1,869,204,394**	
	මූලධන වියදම්				
20,260,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	15,781,981	128,153,856	
9,581,610	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	8,244,428	229,457,058	
509,311	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	509,311	-	**ඒසිඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	**13**	-	-	
2,260,000	හැකියා වර්ධනය	**14**	2,030,315	4,381,198	
2,990,689	වෙනත් මූලධන වියදම්	**15**	1,470,021	26,104,812	
35,601,610	**මුළු මූලධන වියදම් (උ)**		**28,036,056**	**388,096,924**	
	නැන්පතු ගෙවීම්		16,754,434	20,561,899	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		31,179,573	48,542,880	**ඒසිඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**47,934,008**	**69,104,779**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		1,915,176,153	2,326,406,097	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(199,614,207)**	**(273,045,650)**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශනය අනුව ශේෂය		**(199,614,207)**	**(273,045,650)**	**ඒසිඒ-7**
1,959,645,500	**දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය**		**-**	**-**	**ඒසිඒ-3**
			(199,614,207)	**(273,045,650)**	

3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

					ඒසීඒ-පී
2022 දෙසැම්බර් 31 දිනට					
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය					
				තත්‍ය	
		සටහන		**2022**	**2021**
				රු.	රු.
මූල්‍ය නොවන වත්කම්					
දේපළ, පිරියත හා උපකරණ		ඒසීඒ-6		5,015,761,262	5,000,834,912
මූල්‍ය වත්කම්					
අත්තිකාරම් ගිණුම්		ඒසීඒ-5/5(ඒ)		108,165,098	118,920,930
මුදල් හා මුදල් සමාන දෑ		ඒසීඒ-3		-	-
මුළු වත්කම්				**5,123,926,361**	**5,119,755,842**
ශුද්ධ වත්කම් / ස්කන්ධය					
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්				102,662,223	111,152,162
දේපළ පිරියත හා උපකරණ සංචිතය				5,015,761,262	5,000,834,912
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය		ඒසීඒ-5(බී)		-	
ජංගම වගකීම්					
තැන්පතු ගිණුම්		ඒසීඒ-4		5,502,875	7,768,768
අග්‍රිම ශේෂය		ඒසීඒ-3		-	-
මුළු වගකීම්				**5,123,926,361**	**5,119,755,842**

පිටු අංක 6 සිට 76 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 77 සිට 100 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු. මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.



3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

නැත.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය (රු.000)

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ප්‍රතිශතයක් ලෙස
2002.01.01	ගොඩනැගිලි කුලී	1,850	1,100	1,164	106%
2002.02.99	පොළිය	3,750	3,750	3,423	91%
2003.99.00	අනෙකුත් ආදායම්	32,000	15,000	21,564	144%
2006.02.02	මූල්‍ය නොවන වත්කම් විකිණීමේ අදායම	30	30	83	277%

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

(රු, 000)

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලබන ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,925,000	1,924,044	1,839,206	96%
ප්‍රාග්ධන	32,000	35,602	28,036	79%

3.7 මු. රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

(රු. 000)

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	මූල්‍ය ප්‍රගතිය %
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	සෞඛ්‍ය අමාත්‍යාංශය	1. 2022 අයවැය යෝජනා යටතේ මහජනතාව කෙන්ද්‍ර කරගත් සෞඛ්‍ය සේවාවක් පවත්වාගෙන යාම සඳහා වෙන් කල ප්‍රතිපාදන	415,000	21,670	21,670	100%
		2. බොරැල්ල රෝහලේ ගොඩනැගිලි වැඩි දියුණු කිරීම සඳහා	66	66	66	100%
02	රාජ්‍ය පරිපාලන, ස්වදේශීය කටයුතු හා පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශය	රැකියා විරහිත උපාධිධාරීන් රැකියාගත කිරීම සඳහා 2022 වර්ෂයේ දී බඳවාගනු ලැබූ සංවර්ධන නිලධාරීන් මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කිරීම මත වැටුප් හා දිමනා ගෙවීම සඳහා ප්‍රතිපාදන ලබා දීම	14,639	14,639	14,639	100%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

(රු, 000)

වත්කම් කේතය	කේත විස්තරය	**2022.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**2022.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	1,161,120	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	480,581	-	-
9153	ඉඩම්	-	2,338,520	-	-
9160	WIP (කෙරීගෙන යන වැඩ)	-	1,035,540	-	-

3.9 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } MED/A/AD/FA/22/01 මගේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 25 දින

ආයුර්වේද කොමසාරිස්
ආයුර්වේද දෙපාර්තමේන්තුව

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සමපිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන්

මූලධර්මවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී. ලං. වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය. ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයන් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයින් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකපුයුම්වභාව පුහුව ක්‍රියා කරන ලදී. එා වගන් කවුරුවහා,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින්

සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
ශීර්ෂය- 220 ආයුර්වේද දෙපාර්තමේන්තුව 2021 154 (6) වාර්තාව		
1.6.3 (අ)	මුදල් රෙගුලාසි 891 (1) ප්‍රකාරව, ඇප තැන්පත් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.	මුදල් රෙගුලාසි 891(1) හි සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනය පවත්වා ගත යුතුය.
1.6.3 (ආ)	හානි හා පාඩු ලේඛනය පිළියෙල කර තිබුණු නමුත් එය මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව පිළියෙල කර නොතිබුණු අතර එය යාවත්කාලීන කර නොතිබුණි.	මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි හා පාඩු ලේඛනය පවත්වා ගත යුතුය.

1.6.4 (අ)	1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව ආයුර්වේද ආරෝග්‍ය ශාලා, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර, ආයුර්වේද ඖෂධ ශාලා හෝ ආයුර්වේද බෙහෙත් ගබඩා ආයුර්වේද කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු වුවද, පංචකර්ම සහ සම්බාහන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ විධිවිධාන පනතට ඇතුළත් කර නොතිබුණු බැවින් පංචකර්ම වෛද්‍ය ක්‍රමය භාවිතය නියාමනය කළ නොහැකිවී තිබුණි.	පංචකර්ම සහ සම්බාහන මධ්‍යස්ථාන නියාමනය සඳහා විධිමත් නෛතික රාමුවක් ඇතිකිරීම සඳහා කටයුතු කළ යුතුය.
3.3	අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන හා ශක්‍යතා අධ්‍යයනයකින් තොරව 2015 මාර්තු 16 දින රු.මිලියන 28 ක් වැයකර බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණායතනයට යන්ත්‍ර හා උපකරණ 14 ක් මිලදී ගෙන තිබුණු අතර ඉන් රු.මිලියන 21 ක් වටිනා යන්ත්‍ර 8 ක් 2021 ඔක්තෝබර් 15 වන විටත් සවිකර නොතිබුණි. මුළු පිරිවැය රු.14,591,311 ක් වූ යන්ත්‍ර 06 ක් නිෂ්පාදනාගාරය සඳහා අවශ්‍ය නොවන බවට 2020 ඔක්තෝබර් 05 දින පත්කර තිබුණු කමිටුවක් විසින් හඳුනාගෙන තිබුණි. නිසි කොන්ත්‍රාත් ගිවිසුමකට සහ සේවා හා අළුත්වැඩියා සඳහා ගිවිසුම්වලට එළඹීමකින් තොරව මෙම කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කර තිබුණු බැවින් සවිකර තිබුණු යන්ත්‍ර උපකරණද සමාලෝචිත වර්ෂය වන විට භාවිතයට ගත නොහැකි තත්වයේ පැවතුණි. මේ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා වැය කර තිබුණු රු.28,342,712 ක මුළු මුදල අනාර්ථික වියදමක් විය.	සියළුම යන්ත්‍ර උලදායි ලෙස උපයෝජනය කිරීමට හෝ ආයුර්වේද රෝහල්වල හෝ ආයුර්වේද සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනයට යොදා ගැනීම සඳහා ලබාදීමට කටයුතු කළ යුතු අතර අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන හා නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව මෙම මිලදී ගැනීම සඳහා දායක වූ සියළුම නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගත යුතුය.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට දෙපාර්තමේන්තුව විසින් අයිතිය පවරා ගන්නා ලද ඉඩම 08 ක් සහ අයිතිය පවරා නොගන්නා ලද ඉඩම 19 ක් වශයෙන් ඉඩම 27 ක් පැවැති අතර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු එකතුව රු.2,338,520,000ක් වූ ඉඩම 13 ක වටිනාකම තුළට 2023 අප්‍රේල් මස 10 දින වන විටත් අයිතිය පවරා නොගත් එකතුව රු. 2,318,020,000 ක් වූ ඉඩම් 12 ක්ද අයිතිය පවරාගත් රු.20,500,000 ක් වූ පින්නදූව ඔසු උයන ඉඩම පමණක්ද ඇතුළත්ව තිබුණු අතර පවරාගත් අනෙකුත් ඉඩම් 07 හි වටිනාකම ඇතුලත්ව නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු පරිදි දෙපාර්තමේන්තුවේ ඉඩම් 16 ක පිහිටි ගොඩනැගිලිවල වටිනාකම රු.1,161,120,186 ක් විය. මෙම වටිනාකම තුල දෙපාර්තමේන්තුව වෙත පවරා නොගන්නා ලද ඉඩම් 13 ක පිහිටි ගොඩනැගිලිවල වටිනාකම වූ රු. 1,107,464,440 ක්ද ඇතුළත්ව තිබුණි.

(ඇ) මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද CGO/ASM/Policy/Cir/(VOL III) හා 2023 ජනවාරි 18 දිනැති අංක 1/2023 දරන වත්කම් කළමණාකරන චක්‍රලේඛය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට කොමිසාරිස් ජනරාල්ට වාර්තා කර තිබුණු දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලිවල වටිනාකම රු. 567,396,547 ක් වූ අතර ගිණුම්ගත කළ වටිනාකම රු. 1,161,120,186 ක් වූයෙන් රු.593,723,635 ක ශුද්ධ වෙනසක් නිරීක්ෂණය විය. රු. 563,416,490 ක් වටිනා ගොඩනැගිලි 14 ක් කොමිසාරිස් ජනරාල්ට වාර්තා නොකිරීමත්,බොරැල්ල රෝහලේ ගොඩනැගිලි වටිනාකම රු. 93,934,658 ක් අඩුවෙන් හා තිරප්පනේ ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිලි වටිනාකම රු 7,430,962 ක් වැඩියෙන් වාර්තා කිරීමත්, රු 56,196,547 ක් වටිනා ගොඩනැගිලි 12 ක් කොමිසාරිස් ජනරාල්ට වාර්තා කළ නමුත් ගිණුම්ගත නොකිරීමත් මෙම වෙනසට හේතුවී තිබුණි.

(ඇ) සිගාස් පරිගණක මුද්‍රිත සටහන් ප්‍රකාරව වෙනත් යන්ත්‍ර හා උපකරණ වැය විෂයය යටතේ රු.10,905,422 ක් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයට ගලපා තිබුණද ඊට අදාල විස්තරාත්මක තොරතුරු පිළියෙල කර නොතිබුණු අතර ආරම්භක ශේෂයන්ට සිදු කරන ලද එම සංශෝධන පිළිබඳ ගිණුම් සටහන් වලින් හෙලිදරව් කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ඊ) දෙපාර්තමේන්තුවේ සිගාස් පරිගණක පද්ධතියේ පවත්වා තිබුණු මූල්‍ය නොවන වත්කම් ලේඛනය අනුව රු. 90,875,713ක් වූ කාර්යාල උපකරණ හා විදුලි උපකරණ ශේෂය රු.91,218,614 ක් ලෙස රු.342,901ක් වැඩියෙන්ද රු.275,315,783 ක් වූ වෛද්‍ය උපකරණ ශේෂය රු. 273,099,263 ක් ලෙස රු.2,216,520 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබුණු පරිගණක උපාංග ශේෂය, විදුලි උපකරණ ශේෂය සහ වෛද්‍ය උපකරණ ශේෂය පිළිවෙලින් රු. 5,881,397 ක්, රු. 14,835,143 ක් සහ රු. 275,315,783 ක් විය. එසේ වුවද, පිළිවෙලින් ඉකුත් වර්ෂවල සිදුකළ රු. 10,375,439 ක රු. 6,273,197 ක සහ රු. 3,638,628 ක මිලදීගැනීම් අදාළ විෂයයන් යටතේ නොදක්වා කාර්යාල උපකරණ යටතේ දක්වා තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබුණු රු. 20,729,160 පරිගනක මිලදී ගැනීම්, මූල්‍ය නොවන වත්කම්වල පරිගණක උපාංග යටතේ දැක්විය යුතු වුවත් එසේ දක්වා නොතිබුණි.

(ඌ) ධාවන තත්ත්වයේ නොමැති කැබ රථ 02 ක්, බස් රථයක් හා යතුරු පැදි 04ක් අපහරණ කටයුතු සඳහා 2022 පෙබරවාරි 14 දින සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත භාරදී තිබුණද, මූල්‍ය ප්‍රකාශනවල සටහනක් මගින් එම වත්කම් පිළිබඳ තොරතුරු අනාවරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) කල්බදු වාරික ගෙවීම් ක්‍රමය යටතේ 2012 වර්ෂයේදී ටොයෝටා ලංකා ආයතනයෙන් මිලදී ගෙන තිබුණු පිරිවැය රු.8,400,000 ක් වූ වෑන් රථයක් කල්බදු කාලසීමාවෙන් අනතුරුව දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන තිබුණද, මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) වැඩ අවසන් ගොඩනැගිලි හා වනුභවල පිරිවැය ප්‍රාග්ධනිත නොකර 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ඉදිකිරීම් සඳහා දැරූ සම්පූර්ණ වියදම කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය රු.1,035,539,978 ක් දක්වා වර්ධනය වී තිබුණි.

1.6.1.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

දෙපාර්තමේන්තුව සතුව රු.93,944,999 ක් වටිනා වාහන පවතින බව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර තිබුණු නමුත් සිගාස් පරිගණක පද්ධතියේ එක් එක් වාහනය පිළිබඳ විස්තරාත්මක තොරතුරු සඳහන් කර නොතිබුණු බැවින් දෙපාර්තමේන්තුව සතු සියලු වාහනවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල නිරූපනයවන බවට තහවුරු කර ගැනීමට නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1. වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බව පහත දැක්වෙන කරුණු අනුව නිරීක්ෂණය විය.

(අ) මූලධන වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු. 1,000,000 ක ප්‍රතිපාදනවලින් රු.658,378 ක් එම වැය විෂයන්හි අරමුණුගත කාර්යයන් සඳහා වැය නොකර වෙනත් මූලධන වැය විෂයන්ට මාරු කර තිබුණු අතර රු. 341,622 ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.

(ආ) මූලධන වැය විෂයයන් 07 ක් සඳහා සලසාගෙන තිබුණු රු.7,444,039 ක ප්‍රතිපාදනවලින් රු. 3,712,693 ක් හෙවත් සියයට 40 ත් සියයට 63 ත් අතර පරාසයක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.

(ඇ) අවශ්‍යතාවය නිසියාකාරව හඳුනා ගැනීමකින් තොරව ප්‍රතිපාදන මාරුකිරීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 06 කට වෙනත් වැය විෂයයන්ගෙන් මාරුකරගෙන තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 26 ත් සියයට 1148 ත් අතර පරාසයක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 94(1) විධි විධාන වලට පටහැනිව පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 10ක රු. 6,181,465 ක් වූ ඉතිරිවීම් ඉක්මවා රු. 6,645,042 ක බැරකම්වලට [illegible]

(ආ) ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන් ලබාගත් ඖෂධ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 11,334,668 ක් ගෙවිය යුතුව පවතින බව එම සංස්ථාවේ ගිණුම් අනුව තහවුරු වූ නමුත් අදාළ බැරකම රු. 7,027,978 ක් ලෙස දෙපාර්තමේන්තුවේ බැරකම් හා බැඳීම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂවලදී ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන් ලබා ගෙන තිබුණු ඖෂධ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,272,068ක් ගෙවිය යුතුව පවතින බව එම සංස්ථාවේ ගිණුම් අනුව තහවුරු වූ නමුත් එම බැරකම දෙපාර්තමේන්තුවේ බැරකම් හා බැදීම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

නීති රීති විධිවිධානවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තිය	දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 371 (ආ)	නිලධාරීන් 04 දෙනෙකු වෙත අවස්ථා 04 කදී ලබා දෙන ලද එකතුව රු. 188,250 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම වැය නොකර දින 02 ත් 10 අතර කාලයක් එම මුදල් අත රඳවා ගෙන මුළු මුදලම පියවා තිබුණි.
(ii) මුදල් රෙගුලාසි 395 (අ)	සමාලෝචිත වර්ෂයේ ජනවාරි සහ පෙබරවාරි මාස වලින් පසු බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iii) මුදල් රෙගුලාසි 571	භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුම් 3 ක පැවැති වසර 2 ත් 5 ත් අතර කල් ඉකුත් වූ හා එකතුව රු.189,646 ක් වූ තැන්පතු නියාදනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද වසර 2 ඉක්මවූ තැන්පතු පැවතීමට හේතුවූ කරුණු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ 03 ප්‍රකාරව වාර්තා කර නොතිබුණි.
(iv) මුදල් රෙගුලාසි 770(4)	මුදල් රෙගුලාසි 770(4) අනුව ධාවනයෙන් ඉවත්කර වසර ගණනාවක් ගතව තිබුණු පිජ් රථයක් හා වෑන් රථයක් අළුත්වැඩියාකර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට 2023 මැයි 09 වන විටද, කටයුතුකර නොතිබුණි.
(v) මුදල් රෙගුලාසි 1646	වාහන භාර නිලධාරීන් විසින් වාර්තාව ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊලඟ මාසයේ 15 වැනි දින ගතවන්නට ප්‍රථමයෙන් ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපතද සමඟ ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් විගණකාධිපති වෙත යැවිය යුතු වුවත්, දෙපාර්තමේන්තුව සතුව ඇති යතුරු පැදි ඇතුළු වාහන 53 ක් සම්බන්ධයෙන් එකී විධි විධාන ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.
(vi) මුදල් රෙගුලාසි 1647 (ආ)	වාහනද ඒවායේ උපකරණද ඇතුළුව සම්පූර්ණ සමීක්ෂණයක් පැවැත්විය යුතු වුවද, දෙපාර්තමේන්තුව සතුව ඇති යතුරු පැදි ඇතුළු වාහන 55 ක් සම්බන්ධයෙන් එකී විධි විධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(vii) මුදල් රෙගුලාසි 1647 (ඉ)	වාහන භාර නිලධාරීන් විසින් තමා භාරයේ ඇති මෝටර් වාහන පිළිබඳව ඒ ඒ වාහනයේ වර්ගය හා මෝස්තරයද, ලියාපදිංචි කිරීමේ අංකයද, තමාට භාරදුන් දිනයද, පැවරූ දිනය හා ඒ පිළිබඳ විස්තරද වෙනත් නිසි තොරතුරුද දැක්වෙන ලැයිස්තුවක් තබාගත යුතු වුවත් එකී විධි විධාන ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

(ඇ)	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	චක්‍රලේඛයේ ඇමුණුම් අංක 02 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් සකස්කර කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 ට නොඅඩු පුහුණු අවස්ථාවක් එම සැලැස්ම තුළ තහවුරු කළ යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි.
(ඈ)	2019 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2(iv) ඡේදය	වේලාව පදනම් කර ගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමේදී අදාළ කාලය ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කර ගත යුතු වුවද, ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයකින් තොරව පැමිණීමේ ලේඛන පමණක් පදනම් කර ගනිමින් සමාලෝචිත වර්ෂය තුළදී අතිකාල හා නිවාඩු දින වැටුප් ලෙස රු. 63,411,490 ක් ගෙවා තිබුණි.
(ඉ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.5 ඡේදය	රාජ්‍ය ආයතන හඳුන්වාදෙන නව ගාස්තු සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගත යුතු වුවද ආයුර්වේද පනත හෝ වෙනත් එවැනි ලිඛිත නීතියක් මඟින් ප්‍රතිපාදන සලසා නොගෙන සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ සේවා ලාභීන්ගෙන් එකතුකළ රු. 21,564,057 ක් වූ විවිධ ගාස්තු භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අදායම් සංකේතාංක 20.03.99.00 හෙවත් විකුණුම් සහ ගාස්තු යන ආදායම් සංකේතය යටතේ රාජ්‍ය ආදායමට බැර කර තිබුණි. තවද, යෝග සංග්‍රහ කමිටුවේ අනුමැතිය මත ආයුර්වේද කොමසාරිස්වරයා නිකුත් කර තිබූ අභ්‍යන්තර චක්‍රලේඛ අනුව හා ආයුර්වේද කොමසාරිස්වරයාගේ සභාපතිත්වයෙන් යුත් ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍ය ශාලා මණ්ඩල තීරණ අනුව හා ආයුර්වේද කොමසාරිස්වරයාගේ අභිමතය පරිදි උක්ත ගාස්තු ප්‍රමාණ තීරණය කර තිබුණි.

(ඇ)	2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 04 (අ) ,(ඇ) හා උපලේඛන අංක 01	අයවීමට ඇති ආදායම් ප්‍රමාණය, එකතු කරන ලද සහ හිඟ අදායම් කිසිවක් වේ නම් එම ප්‍රමාණය පැහැදිලිව දැක්වෙන අයුරින් ක්‍රමවත්ව වාර්තා පවත්වාගෙන ගොස් නොතිබුණි. එකතු කරන ලද ආදායම් රැස්කිරීමේ ගිණුම්වල හෝ තැන්පත් ගිනුම්වල නොතබා එළැඹෙන මාසයේ පළමු සතිය තුළ නිවැරදිව වර්ගීකරණය කර ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවද 2020 ජනවාරි 01 සිට 2022 අප්‍රේල් 30 දක්වා පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණු එකතුව රු.4,336,500ක ගෙවන වාටිටු ගාස්තු 2022 අගෝස්තු 08 දින දක්වාම රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ රැස්කළ එකතුව රු.1,163,684 ක් වූ සංචාරක නිවාස හා නේවාසිකාගාර අදායම් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අදායම් සංකේතාංක 20.2.01.01ට බැර කර නොතිබුණි.

2.4 අත්තිකාරම් ගිණුම් ශේෂ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 1.6, 1.7 හා 6.3 වගන්ති හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදය ප්‍රකාරව, ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ තෙමසක් තුළ නිරවුල් කළ යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 314,439 ක් වූ ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 09 දෙනෙකුගේ ණය ශේෂ වර්ෂ 05 ක කාල සීමාවක් ඉක්මවා තිබුණු අතර රු.177,760 ක ණය ශේෂයක් මාස මාස 09 කාලයක් ඉක්මවා තිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 3:2 වගන්තිය ප්‍රකාරව ණය දීමට කලින් හෝ පසුව හෝ අප්‍රමාදව, ණය ලබා ගන්නා නිලධාරියා විසින් තහවුරු කිරීමේ සියලුම ලියකියවිලි ඉදිරිපත් කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ එකතුව රු.1,300,000 ක ආපදා ණය ලබාගත් නිලධාරීන් 06 දෙනෙකු විසින් එකී විධිවිධාන ප්‍රකාරව ඇස්තමේන්තු, බිල් පත් ආදී තහවුරු කිරීමේ ලියවිලි ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.2.4 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නිලධාරියෙකු විශ්‍රාම ගැනීමට නියමිතව ඇති කල්හි ඔහුගෙන් අයවිය යුතු සියළුම ණය පිළිබඳ විස්තර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු අතර, 4.2.5 වගන්තිය ප්‍රකාරව නිලධාරියාගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂික මුදල්වලින් හෝ අයකර ගත යුතුය. 2022 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගියාහු මාස 20 ක් ඉක්ම වූ නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු මුළු ණය ශේෂය රු.393,510 ක් වූ අතර එම ණය අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද, එම ණය ශේෂ අතරට විශ්‍රාම ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු වසර 04 කට වඩා පැරණි රු. 243,210 ක ශේෂයක් ද ඇතුළත්ව තිබුණි.

තවද, ණය ශේෂ එකතුව රු. 62,500 ක් වූ නිලධාරීන් 03 දෙනෙකුගේ පෞද්ගලික ලිපිගොනු දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5, 4.6 හා 6.3 වගන්ති, 2019 ජූනි 27 දිනැති අංක 05/2019 දරණ රාජ්‍ය මුදල් චක්‍ර ලේඛනයෙහි 03 (ආ) ඡේදය හා 2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛනයෙහි 04 ඡේදය ප්‍රකාරව මිය ගිය නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වුවත්, 2022 දෙසැම්බර් 31 දිනට මිය ගොස් මාස 12 ඉක්ම වූ නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 599,344 ක් වූ ණය ශේෂ අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. තවද, එම ණය ශේෂ අතරට මිය ගිය නිලධාරීන් 03 දෙනෙකුගේ අය විය යුතු වසර 05කට වඩා පැරණි රු.231,800 ක් ද ඇතුළත්ව තිබුණද, එම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු ඇතුළු නොරතුරු කිසිවක් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

(ඉ) ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 21.3 වගන්තිය ප්‍රකාරව, වැඩ තහනමට ලක්වූ නිලධාරීන් සම්බන්ධයෙන් පැවැත්වෙන විනය පරීක්ෂණ කටයුතු හැකිතාක් අප්‍රමාදව අවසන් කිරීම අත්‍යාවශ්‍ය වුවද, වැඩ තහනමට ලක්වී වර්ෂ 1ත් වර්ෂ 3ත් අතර කාලයක් ගතවී තිබුණු නිලධාරීන් 04 දෙනෙකුගෙන් රු. රු. 425,060 ක් ද, වර්ෂ 05 ක කාලයක් ඉක්මවා තිබුණු නිලධාරීන් 05 දෙනෙකුගෙන් රු. 127,060 ක් ද, අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි.

(ඊ) 2019 ජූනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3(ඉ)(ii) ප්‍රකාරව, සේවය හැර ගිය නමුත් නැවත සේවයේ පිහිටුවා නොතිබුණු නිලධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය මැනිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කර පදිංචිය පිළිබඳව විස්තර විමසා ප්‍රාදේශීය ලේකම් මගින් එම නිලධාරීන්ගේ වත්කම් පිළිබඳව තහවුරු කර ගැනීමෙන් අනතුරුව නීතිපති මගින් ණය මුදල අයකර ගත යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දින වන විට සේවය හැරගිය නිලධාරීන් 22 දෙනෙකුගෙන් අයවිය යුතු මුළු ණය ශේෂය වූ රු. 1,147,660 ක් එකී විධිවිධාන ප්‍රකාරව අයකර ගෙන නොතිබුණු අතර ඉන් සියයට 67 ක් හෙවත් රු.766,160 ක් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක් පැරණි ණය ශේෂ විය.

2.5 පාඩු හා හානිවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හම්බන්තොට වමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහලේ දැල් වැටෙන් කොටසක් සොරුන් විසින් කපාගෙන ගොස් තිබුණු අතර එහි අලාභය රු. 763,360 ක් ලෙස දෙපාර්තමේන්තු ඉංජිනේරු විසින් තක්සේරු කර තිබුණි. රෝහලේ ආරක්ෂක සේවා ගිවිසුමේ 25 වගන්තිය ප්‍රකාරව අලාභයෙන් සියයට 40ක් ආරක්ෂක සේවා සමාගමෙන් අයකර ගැනීමට සිද්ධියට අදාලව පත්කළ පරීක්ෂණ නිලධාරියා තීරණය කර තිබුණු අතර ඉංජිනේරු තක්සේරුවෙන් සියයට 40ක් හෙවත් රු. 305,344 ක් අය කළ යුතුව තිබුණද් ඉංජිනේරු වෘත්තාවයකින් තොරව අදාළ මුල අලාභය රු. 252,235 ක් ලෙස සංශෝධනය කර ඉන් සියයට 40 ක් හෙවත් රු.100,894 ක් පමණක් ආරක්ෂක සේවා සමාගමෙන් අයකර ගැනීමට කටයුතු කර තිබුණි.

(ආ) මංවංතොඩුවායි ආයුර්වේද රෝහලේ සේවය කර වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට ස්ථාන මාරුවී තිබුණු ආයුර්වේද වෛද්‍යවරයෙකුට 2012 ජූලි මාසයේ සිට 2013 සැප්තැම්බර් මාසය දක්වා මාස 15 ක් තුළදී දෙපාර්තමේන්තුව විසින් වැටුප් ලෙස රු.548,376 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු නොකර සියයට 25ක අධිභාරයක්ද ද සමඟ 2023 මාර්තු 02 දින වන විට රු.354,600ක් පමණක් අයකර ගෙන තිබුණි. මෙම සිද්ධියට වසර 10කට අධික කාලයක් ගතවී තිබුණු නමුත් ඉතිරි රු.330,870 ක මුදල් එහාම අයකර ගැනීම සඳහා අදාළ වෛද්‍යවරයාට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීමට හෝ මුදල් රෙගුලාසි 104 (2) "ආ"පරිදි වගකිවයුතු නිලධාරීන්ගෙන් අධිභාර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යය සාධනය

3.1.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත් ඊට අනුගතව කටයුතු කර නොතිබුණු අතර අරමුණු හා ප්‍රතිපත්ති වෙනස් කිරීමේදී ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්තු පදනමින් ප්‍රගතිය වාර්තා කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණු අතර 2023 අප්‍රේල් 20 දින වන විටත් ක්‍රියාකාරී සැලැස්මට අනුව භෞතික ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණි .

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව සෞඛ්‍ය සත්කාර සේවයේ වර්ධනය සඳහා ධාරිතා සංවර්ධනය යටතේ පුහුණු වැඩසටහන් පවත්වා සේවකයන් 100 දෙනෙකු පුහුණු කිරීමට සැලසුම්කර තිබුණු නමුත් සේවකයන් 19 දෙනෙකු පමණක් පුහුණුකර තිබුණි.

3.1.2 කාර්යයභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන 2001 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා නියමු ව්‍යාපෘතියක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කර එහි සාර්ථකත්වය අනුව 2005 වර්ෂයේ සිට අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා සේවා ව්‍යාප්ත කළ යුතු වුවද, අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පමණක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. 2005 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු.මිලියන 877.2 ක් වැය කර තිබුණු මෙම ව්‍යාපෘතිය සඳහා 2022 වර්ෂයේ වෙනම ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණු අතර සංවර්ධන වැඩසටහනේ රෝගී ප්‍රතිකාර සේවා ව්‍යාපෘතිය යටතේ වැටුප්, දීමනා, ගිවිසුම්ගත සේවා ඇතුළු පුනරාවර්තන වියදම් සඳහා පමණක් ප්‍රතිපාදන සලසා ගෙන නිලධාරීන් 218 දෙනෙකුට වැටුප් හා දීමනා වශයෙන් රු.මිලියන 148.3 ක්ද අනෙකුත් වියදම් සඳහා රු.මිලියන 4.5 ක්ද වශයෙන් මුළු එකතුව රු.මිලියන 152.8 ක් වැයකර තිබුණි. ඒ අනුව අනෙකුත් දිස්ත්‍රික්ක ආවරණය කරමින් ව්‍යාප්ත කිරීමට තරම් සාර්ථකත්ව ක්‍රියාත්මක නොවූ මෙම ව්‍යාපෘතියට අදාළ පුනරාවර්තන වියදම් පමණක් දෙපාර්තමේන්තුවෙ වැය විෂයයන් මගින් ආවරණය කරමින් ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන තව දුරටත් පවත්වාගෙන යාමට කටයුතු කිරීම මතභේදයට තුඩුදෙන කරුණකි.

(ආ) ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු. 350,000,000 ක්වූ පාරම්පරික වෛද්‍ය දැනුම සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතියේ II වන අදියර 2020 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 04 ක් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා 2019 අප්‍රේල් 03 දින අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබාගෙන තිබුණු නමුත් 2020 වර්ෂයේදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා රු. 1,500,000 ක ප්‍රතිපාදන සලසා ගෙන කාර්යයන් 04 ක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණු අතර ඉන් එක් කාර්යයක් වනම් පාරම්පරික වෛද්‍යවරුන් ඇගැයීම සඳහා පමණක් රු.697,408 ක් වැයකර තිබුණි. ඒ අනුව පුස්තකාලයක් ස්ථාපිත කිරීම, පාරම්පරික වෛද්‍ය දැනුම සංරක්ෂණය කිරීම හා මිහින්තලේ ආයුර්වේද පර්යේෂණ රෝහලේ පර්යේෂණ කටයුතු යන කාර්යයන් ඉටුකර නොතිබුණි.

(ඇ) ආයුර්වේද දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියම ඇතුළත්වන පරිදි කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) සැකසීම සඳහා ඉකුත් වර්ෂයේ මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද රු. මිලියන 25 බැගින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණු නමුත් එම කාර්යය ඉටුකර නොතිබුණි.

3.1.3 කාර්යය සාධන දර්ශක

දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන ඔසු උයන් ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියට අදාළ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා නොතිබුණු අතර ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සමාලෝචනයද කර නොතිබුණි.

3.1.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන සමඟ 2022 වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත්කර තිබුණු නමුත් එය 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය යටතේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව නිවැරදිව පිළියෙල කර නොතිබුණි.

(ආ) 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසානවී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2021 වර්ෂයේ කාර්යසාධන වාර්තාව 2023 අප්‍රේල් 20 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) [illegible] රෝහල්, ඔසු උයන්, ප්‍රජා සෞඛ්‍ය ප්‍රාදේශීය කාර්යාල, සංචාරක බංගලා ඉඩම් 19 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණි.

(ආ) 2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන චක්කම් කළමනාකරණ වක්‍රලේඛය ප්‍රකාරව චක්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳව කොමිස්ථෝලර් ජනරාල් වෙත වාර්තා කර තිබුණු තොරතුරු නිවැරදි හා යාවත්කාලීන නොවූ බව නිරීක්ෂණය විය. තවද, 2020 සැප්තැම්බර් 30 අංක 05/2020 දරන චක්කම් කළමනාකරණ වක්‍රලේඛය ප්‍රකාරව අලුත්වැඩියා කිරීම් ඵලදායී නොවන හා ඵලදායී වන ධාවන තත්ත්වයේ නොපවතින වාහන පිළිබඳ තොරතුරු කොමිස්ථෝලර් ජනරාල් වෙත වාර්තා කර නොතිබුණි.

3.3 රජයේ නිලධාරීන් ඇප කැබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය නිලධාරීන්ගේ ඇප අඥා පනතේ 612 වැනි අධිකාරිය, මූදල් රෙගුලාසි 880 හා 881 සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මූදල් වක්‍රලේඛකයේ 09 ඡේදය ප්‍රකාරව 2023 මාර්තු 31 දින වන විටත් ආයුර්වේද දෙපාර්තමේන්තුව හා ඊට අයත් ආයතන 09 ක ඇප කැබිය යුතු නිලධාරීන් 20 දෙනෙකු එකී විධිවිධාන ප්‍රකාරව ඇප කැබීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මූදල් රෙගුලාසි 892 ප්‍රකාරව ඇප කැබිය යුතු නිලධාරීන්ගේ සංශෝධිත වාර්තාවක් සෑම වර්ෂ 03 ක් අවසානයට පසුව යෙදෙන පෙබරවාරි 15 දිනට ප්‍රථම අදාල අමාත්‍යාංශයේ ලේකම් හා විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. මෙම වාර්තාව සමඟ තවදුරටත් ඇප කැබීමට අවශ්‍ය නොවන නිලධාරීන්ගේ නම්ද, ඇතුලත් විස්තරාත්මක වාර්තාවක් යැවීමට කටයුතු කල යුතු වුවත් එලෙස ක්‍රියා කර නොතිබුණි.

(ඇ) රෝහල් 04 ක ප්‍රධාන වෛද්‍ය නිලධාරීන් 04 දෙනෙකුගෙන් හා මූදල් අයකැමියන් 05 දෙනෙකුගෙන් පමණක් රු.32,500 ක ඇප තැම්පතු ලබාගෙන තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් සිදු කිරීමේ අරමුණින් පවත්වාගෙන යනු ලබන 6000-0-0-13-0-084 දරන තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණු අතර අනෙකුත් රෝහල්වල ප්‍රධාන වෛද්‍ය නිලධාරීන්ගෙන් හා මූදල් අයකැමියන්ගෙන් ඇප තැම්පතු ලබා නොගැනීමට හේතු ඉදිරිපත් නොවුණි.

3.4 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයේ 4.2.1(ඉ) මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස හයකට වැඩිනොවන කාලයක් තුලදී නිති පතා යාවත්කාලීන කරනු ලැබිය යුතු වුවත් එකී විධි විධාන ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ රෝහල් හා ඔසු උයන් සඳහා සේවා සපයන පෞද්ගලික ආරක්ෂක සේවා සැපයුම් කරුවන්ට සේවා ගිවිසුම් කොන්දේසිවලට පටහැනිව වැඩිපුර ගෙවීම් කළ අවස්ථා පැවැති බව නිරීක්ෂණය විය. ඒ අනුව ආරක්ෂක නිලධාරියෙකු අඛන්ඩව පැය 12කට වඩා වැඩියෙන් සේවයේ යෙදුවහොත් ඒ සඳහා කිසිදු ගෙවීමක් නොකරන බව ගිවිසුමේ දක්වා තිබුණද, ඊට පටහැනිව රෝහල් 11 ක හා ඔසු උයන් 6 ක පැය 12 ඉක්මවා යොදවා තිබුණු සේවා මුර 2,619 ක් වෙනුවෙන් රු.2,668,317 ක්ද, එක් එක් දිනයේ සේවයේ යෙදවිය යුතු නියමිත නියාමකයින් සංඛ්‍යාව සේවයේ නොයෙදවූ විට ඒ සඳහා එක් පුද්ගලයෙකුගේ දිනක වැටුපක් අඩු කිරීමට හා නොපැමිණි සේවකයින් සඳහා නියමිත වැටුප නොගෙවිය යුතු බව දක්වා තිබුණද, ඊට පටහැනිව නියමිත සේවකයින් දෙනිකව සේවයේ නොයෙදූ සේවා මුර 562 ක් වෙනුවෙන් රු. 598,473 ක්ද පෞද්ගලික ආරක්ෂක සේවා සැපයුම් කරුවන් 4 දෙනෙකුට ගෙවා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ජුනි සිට දෙසැම්බර් දක්වා ආයුර්වේද දෙපාර්තමේන්තුව හා ඊට අනුබද්ධිත ආයතන 18ක ආරක්ෂක සේවා සැපයීම සඳහා වූ රු. 74,759,059 ක කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයේ 1.2.1 (ඉ), 2.12, 4.2.2, 4.2.3 සහ 4.3 යන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි. එමෙන්ම ආරක්ෂක සේවා ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව දිනපතා පැය 24 ම ආවරණය වන පරිදි සියළුම සේවා ලක්ෂ්‍යවල නිලධාරීන් යෙදවෙන බව තහවුරු කර ගැනීම පිණිස විධිමත්ව අධීක්ෂණ නිලධාරියකු පත්කර දිනපතා නම් ලැයිස්තු ලබා ගැනීම, ලොග් සටහන් පරීක්ෂා කිරීම, වරින්වර සේවා ලක්ෂ්‍ය පරීක්ෂා කර බැලීම යනාදී අභ්‍යන්තර පරීක්ෂාවන් සිදුකළ බවට තොරතුරු අනාවරණය නොවුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් පරිශ්‍රයන්හි පිරිසිදු කිරීමේ සේවාව සැපයීම සඳහා වූ රු.1,947,258 ක කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් රජයේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4.3, 2.5.1 (ආ), 2.6.1(ආ) (i) සහ 4.2.2 , යන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණ ඇගයීම් කමිටුවල සාමාජිකයින් අදාළ කමිටු සඳහා ප්‍රමුඛත්වය ලබාදී නොතිබුණු අතර ප්‍රසම්පාදන කාල සටහන සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ හා ප්‍රසම්පාදන කමිටුවේ සමාලෝචනය හා එකඟවීමද ලබා දී නොතිබුණු බැවින් ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කර නොතිබුණි.එමෙන්ම අදාළ සේවා ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් සේවකයින්ගේ නම් අත්සන ලිපිනයන් ඇතුළත් වාර්තාවක්ද, පිරිසිදු කිරීමේ රසායන ද්‍රව්‍යවල සංඝටකයන් හා භාවිතයට සුදුසු බවට විධිමත් තත්ත්ව සහතිකයක්ද,දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණු අතර සේවකයන්ට නිල ඇඳුම් හා පැළඳීම් සඳහා හැඳුනුම්පත් සැපයීමටද කටයුතු කර නොතිබුණි. තවද සේවකයින්ගේ පැමිණීම් හා පිටවීම් සම්බන්ධ තොරතුරු හා සේවකයින්ට ගෙවන ලද මාසික වැටුප, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට කරන ලද ප්‍රේෂණ, යනාදී තොරතුරුද කාලීනව සැපයීමට කටයුතු කර නොතිබුණි. මෙම ගිවිසුමට අදාළ කොන්ත්‍රාත් කොන්දේසි ඇතුළත් ලේඛනය ඉවත් කර තිබුණු අතර කොන්ත්‍රාත් ගිවිසුමේ ගිවිසුම් ගනුදෙනු කොන්දේසි යටතේ ගිවිසුමට අදාළ කොන්ත්‍රාත් කොන්දේසි ඇතුළත් ලේඛණය ඉවත් කර අදාල කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත් කොන්දේසි වලින් නෛතික බැඳීමකට ලක්නොවන අයුරින් ක්‍රියාකිරීමට අවස්ථාව ලැබෙන පරිදි කටයුතුකර තිබුණි. තවද, පිරිසිදු කිරීමේ රසායන ද්‍රව්‍ය හා පිරිසිදු කිරීමේ උපකරණ මාසිකව ගබඩාව වෙත ලබාදිය යුතු වුවත් ඒ සම්බන්ධ අභ්‍යන්තර පාලනය ඉතාමත් දුර්වල මට්ටමක පැවැති බවද නිරීක්ෂණය විය.

3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයුර්වේද දෙපාර්තමේන්තුව සතුව අක්කර 272 කට අධික වපසරියක් සහිත ඔසු උයන් 07 ක් පැවැතියද එම උයන්වලින් ලැබෙන ඵලදාව ආයුර්වේද රෝහල් වල ඖෂධ නිෂ්පාදනයට යොදා ගැනීම පිණිස විධිමත් වැඩපිළිවෙලක් භාවිතා කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව සතුව බස් රථ 02 ක්, ලොරි රථ 02 ක්, කැබ රථ 09 ක්, වෑන් රථ 07 ක්, මෝටර් කාර් 05 ක්, ජීප්රථ 02 ක්, ගිලන්රථ 09 ක්, ත්‍රීවිලර් 06 ක් හා ට්‍රැක්ටර් යතුරුපැදි ඇතුළු වාහන 55 ක් පැවැති අතර මෙම වාහනවලට අදාළ ලොග් පොත්, ධාවන සටහන් විධිමත් පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබීම, ඉන්ධන පරීක්ෂාවන් සිදුකර නොතිබීම, වාහන සඳහා ඉන්ධන පිරවීමේදී එම කටයුතු මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සිදුකර නොතිබීම සහ රියදුරන්ගේ අක්‍රමිකතාවයන් වලක්වා ගැනීම සඳහා ප්‍රමාණවත් පාලන ක්‍රම අනුගමනය නොකිරීම යනාදී කරුණු හේතුවෙන් දෙපාර්තමේන්තුවේ වාහන පරිපාලනය හා වාහනවල ආරක්ෂාව සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොපැවැති බව නිරීක්ෂණය විය.

(ඇ) තවදුරටත් අලුත්වැඩියා වන් සිදුකර භාවිතයට ගත නොහැකි HD-3411 වැන්රථය හා 32 ශ්‍රී 1178 දරන ජීප් රථය අලුත්වැඩියා කිරීම සඳහා වර්ෂ ගණනාවක සිට දෙපාර්තුමේන්තු පරිශ්‍රයෙන් පිටත ගරාජයක තබා තිබෙන බව නිරීක්ෂණය විය. තවද අලුත්වැඩියාවන් සිදු කල නොහැකි වාහන උක්ත වක්‍රලේඛය ප්‍රකාරව අපහරනය කිරීමට පියවර නොගැනීම විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් බව නිරීක්ෂණය විය.

4. තිරසර සංවර්ධනය

2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ 3.6, 3.9, 11 හා 11.2 වගන්ති ප්‍රකාරව, ආයතනයේ අරමුණු ළඟාකර ගැනීම උදෙසා සිය සම්පත් කාර්යක්ෂමව මෙහෙයවිය යුතු අතර තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම පිණිස ආයතනය විසින් සපුරාගත යුතු ඉලක්කයන් හා එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින පරතරයන්ද, ප්‍රගතිය මැන බැලීම සඳහා සුදුසු දර්ශකයන්ද හඳුනාගත යුතුය. නමුත් දෙපාර්තමේන්තුව විසින් එවැනි දර්ශකයන් හඳුනාගෙන අරමුණුවලින් ලඟාකරගත් ප්‍රමාණය හා බැහැරවීම් මෙන්ම අවධානය යොමු කළ යුතු විවිධ ක්ෂේත්‍රයන් හඳුනාගෙන නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව සඳහා කළමනාකරණ දත්ත පද්ධතියක් සකස් කර [illegible] කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂයේද අදාළ දත්ත පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල් සහ වෛද්‍ය මධ්‍යස්ථාන ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියට අදාළ යාවත්කාලීන කළමනාකරණ තොරතුරු කාර්යක්ෂමව ලබා ගැනීමට අපහසුව පැවැති අතර දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩල පැමිණීම හා පිටවීම සටහන් කිරීමේ පාලනය කාර්යසාධන පාලනය, වැටුප් පාලනය, අනිකාල වියදම් පාලනය, පුද්ගලික ලිපිගොනු පාලනය යනාදී පාලනයන් දුර්වල මට්ටමක පැවැති බව නිරීක්ෂණය විය.

(ආ) 2022දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය 2,362 ක් වුවද, එදිනට තථ්‍ය කාර්යය මණ්ඩලය 1,371 ක් වූයෙන් අනුමත කාර්යය මණ්ඩලයෙන් සියයට 42 කට සමාන පුරප්පාඩු සංඛ්‍යාව 969 ක් විය. මෙම පුරප්පාඩු තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 83 ක් ද්විතීයික හා තෘතීයික මට්ටම්වල පුරප්පාඩු 368 ක් සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 518 ක් පැවතීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ මෙන්ම ඒ යටතේ වූ රෝහල් වල කාර්යසාධනයට දැඩි බලපෑමක් සිදු වී තිබුණි.

(ඇ) බණ්ඩාරනායක අනුස්මරණ පර්යේෂණ ආයතනය සඳහා එක් එක් විෂය ක්ෂේත්‍රයට අදාළව පර්යේෂණ නිලධාරී තනතුරු 18 ක් හා පර්යේෂණ සහායක තනතුරු 12 ක් අනුමත කරගෙන තිබුණද, ඉන් කිසිවෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර වමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහලට පර්යේෂණ කාර්යය මණ්ඩලයක් අනුමත කරගෙන නොතිබුණි. මේ අනුව ආයුර්වේද පර්යේෂණ රෝහල් පිහිටුවීමෙන් අපේක්ෂිත කාර්යසාධනයට අහිතකර බලපෑමක් සිදු වී තිබුණි.

ජී. මාසකෝරාල
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

ජී.මාසකෝරාල
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

4. පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

2022 වර්ෂය සඳහා කාර්ය සාධන දර්ශක සකස් කර නොමැති අතර 2023 වර්ෂය සඳහා සකස් කරමින් පවතී.

5. පරිච්ඡේදය

5.1 තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

2022 වර්ෂය සඳහා තිරසාර අරමුණු හඳුනා ගෙන නොමැති අතර 2023 වර්ෂය සඳහා සකස් කරමින් පවතී.

5.2 තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ අභියෝග

හඳුනාගනිමින් පවතී.

6. පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	735	630	83
තෘතීයික	43	09	34
ද්විතීයික	549	215	334
ප්‍රාථමික	1035	517	518

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් නිහය බලපා ඇති ආකාරය

I. ආයතනයේ පවතින ඇබෑර්තු හේතුවෙන් දෛනික කටයුතු සිදු කිරීමට දැඩි බාධාවක් එල්ල වී ඇත.
II. නිලධාරීන්ගේ කාර්ය බහුලත්වය නිසා කායික හා මානසික පීඩනය හේතුවෙන් සමස්ථ ඉලක්ක කරා ළඟා වීමට අපහසු වීම.

6.3 මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)
				දේශීය	විදේශීය	
01	රජයේ නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම පිළිබඳ එක් දින වැඩමුළුව - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	07	2022.03.04	35,000.00	-	දේශීය
02	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දෙදින වැඩමුළුව - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	02	2022.03.08 2022.03.09	20,000.00	-	දේශීය
03	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ දෙදින වැඩමුළුව - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	01	2022.03.24 2022.03.25	10,000.00	-	දේශීය
04	පෞද්ගලික ලිපි ගොනුවක් පවත්වාගෙන යාම පිළිබඳ දෙදින වැඩමුළුව - SDFL	04	2022.03.31 2022.04.01	34,000.00	-	දේශීය
05	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'B' ගිණුම පිළියෙල කිරීම පිළිබඳ එක් දින වැඩමුළුව - (ZOOM තාක්ෂණය ඔස්සේ)SDFL	01	2022.03.09	3,750.00	-	දේශීය
06	Certificate course in postgraduate research – Faculty of Medicine University of Colombo	01	2022 පෙබරවාරි 2022 ජූලි	30,000.00	-	දේශීය
07	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	01	2022.11.21 2022.11.28	10,000.00	-	දේශීය
08	ගිණුම් ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	01	2022.12.13	5,000.00	-	දේශීය
09	කාර්යාල සටහන් ලිවීම හා රාජකාරී ලිපි ලිවීම - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	01	2022.11.30	5,000.00	-	දේශීය

7 පරිච්ඡේදය

7 අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම.	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ 445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අදාළ නොවේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම.	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රෙල්ඛය අනුව, රජයේ පඩිපත් මaදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
4.5	වාර්ෂික මූදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම**			

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134(2) DMA/1 – 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම.	අනුකූල නොවේ	පුහුණු සේවකයින් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම.	හැකි සෑම විටම නියමිත දිනට පිළිතුරු ලබා දීමට කටයුතු කරයි.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව. සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදි ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම.	වාර්තා කිරීම සඳහා තොරතුරු සකස් කරමින් පවතී		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්ථා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල නොවේ	පසුගිය වර්ෂ දෙකක පමණ ධාවන සටහන් පරීක්ෂා කර නොතිබීම නිසා ප්‍රමාණවත් කාලයක් නොතිබීම	එම වර්ෂ වල ධාවන සටහන්ද පරීක්ෂා කරමින් පවතී
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කරගෙන පවත්වාගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන වල ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මහ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිවැරදි කර තිබීම.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		
11.2	මු.රෙ 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට පේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්යය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මහ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කොට තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ කාර්යය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමට අවස්ථාව සලසා තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මහ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල නොවේ	පවතින සීමිත මානව හා භෞතික සම්පත් අනුව මෙම කටයුතු නිවැරදිව ක්‍රියාත්මක කළ නොහැක.	ඉදිරියේදී අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලැබීම අනුව කටයුතු කරනු ලැබේ.
18.2	එම චක්‍රලේඛයේ 2.3 වේදයේ පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කාරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ	පවතින සීමිත මානව හා භෞතික සම්පත් අනුව මෙම කටයුතු නිවැරදිව ක්‍රියාත්මක කළ නොහැක.	ඉදිරියේදී අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලැබීම අනුව කටයුතු කරනු ලැබේ.
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ	පවතින සීමිත මානව හා භෞතික සම්පත් අනුව මෙම කටයුතු නිවැරදිව ක්‍රියාත්මක කළ නොහැක.	ඉදිරියේදී අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලැබීම අනුව කටයුතු කරනු ලැබේ.
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12ට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල නොවේ	පවතින සීමිත මානව හා භෞතික සම්පත් අනුව මෙම කටයුතු නිවැරදිව ක්‍රියාත්මක කළ නොහැක.	ඉදිරියේදී අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලැබීම අනුව කටයුතු කරනු ලැබේ.
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල නොවේ	පවතින සීමිත මානව හා භෞතික සම්පත් අනුව මෙම කටයුතු නිවැරදිව ක්‍රියාත්මක කළ නොහැක.	ඉදිරියේදී අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලැබීම අනුව කටයුතු කරනු ලැබේ.

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
19.4	ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල නොවේ	පවතින සීමිත මානව හා භෞතික සම්පත් අනුව මෙම කටයුතු නිවැරදිව ක්‍රියාත්මක කළ නොහැක.	ඉදිරියේදී අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලැබීම අනුව කටයුතු කරනු ලැබේ.
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		